[ Annex 3(b) ]

# විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය



විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2012

# විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය යනු විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා අධ්‍යයන, පරිපාලන, සහායක කාර්ය මණ්ඩල සහ පොදු ජනයා සඳහා වන මාර්ගෝපදේශනයක් වන අතර මෙම ආයෝජනය තුලින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ඵලදාව රටට දායාද කරන්නකි.**


## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**අංක 20**
**වෝඩ් පෙදෙස**
**කොළඹ 7**

සියලුම හිමිකම් ඇවරිණි.

ප්‍රකාශන හිමිකම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතුය.

ISBN: 978-955-583-114-7

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රකාශනයකි.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | 05 |

## පළමු කොටස

| | |
|---|---|
| විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තියට හැඳින්වීමක් | 08 |
| රාජ්‍ය විශ්වවිද්‍යාල පාලනය කෙරෙන මාර්ගොපදේශක ප්‍රතිපත්ති | 10 |
| විවෘත භාවය | 11 |
| සාධාරණත්වය සහ විවිධත්වය | 11 |
| ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ සමාජ සම්මුතීන් ආරක්ෂා කිරීම කෙරෙහි වන කැපවීම | 12 |
| රාජ්‍ය විශ්වවිද්‍යාල භූමිකා | 13 |
| ඉගැන්වීමේ හා ඉගැනීමේ විශිෂ්ඨ මධ්‍යස්ථාන | 13 |
| පර්යේෂණ සහ නවීකරණය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථාන | 15 |

## දෙවන කොටස

| | |
|---|---|
| ශාස්ත්‍රීය පරිසරය සහ ශිෂ්‍ය ආධාරක සේවා | 18 |
| නේවාසික පහසුකම් | 18 |
| සෞඛ්‍ය සේවා | 18 |
| ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය | 19 |
| පුස්තකාල සේවා | 19 |
| තොරතුරු සන්නිවේදන සේවා | 19 |
| වෘත්තීය මාර්ගෝපදේශන සේවා | 20 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන | 20 |
| ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම් | 21 |
| බහු සංස්කෘතික මධ්‍යස්ථාන | 21 |
| ශිෂ්‍ය සහායක සහ සුභසාධක ජාලය | 22 |

## තෙවන කොටස

| | |
|---|---|
| රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාලන විධිය සහ කළමණාකරණය | 24 |
| ශිෂ්‍යභාවය ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රතිපත්ති | 25 |
| ප්‍රකාශන නිදහස | 25 |
| ශිෂ්‍ය නියෝජන | 26 |
| ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය | 26 |
| පෞද්ගලික අයිතිය | 26 |
| විනය පවත්වා ගෙන යෑම, නීතිය හා සාමය ආරක්ෂා කිරීම | 27 |

පිටු අංකය

## සිව්වන කොටස


විශ්වවිද්‍යාලය තුළ තහනම් කොට ඇති සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියා 30

වෙනත් කෙනෙකුගේ නිර්මාණයක් තමාගේ සේ දැක්වීම සහ වංචා කිරීම 30
කළහකාරී හැසිරීම, විසම්මිතිය සහ විරෝධතා දැක්වීම 31
ගරුසරු නැති බව (අවිනීත බව) සහ අවනත නොවීම 31
භාණ්ඩ සේවා සහ තොරතුරු නීති විරෝධී ලෙස භාවිත කිරීම 32
අනවසර මුදල් එකතු කිරීම 33
සම්ප්‍රයාචනය 33
මද්‍යසාර මත්ද්‍රව්‍ය සහ දුම්කොළ විශ්වවිද්‍යාල භූමිය තුළ දී සන්තකයේ තබා ගැනීම සහ පරිභෝජනය 33
සූදුව 33
හිරිහැර කිරීම/ප්‍රචණ්ඩභාවය 34
මානසික වදහිංසාව/නවකවදය 34
ලිංගික අතවර කිරීම 36
සොරකම 36
හිතාමතා හෝ ද්වේශසහගතව දේපළ විනාශ කිරීම/ හානි කිරීම 37
අනවසරයෙන් ඇතුළුවීම 37
බලධාරීන්ට සහාය වීම 37
අභියාචනා අයිතිය 38

රාජ්‍ය විශ්වවිද්‍යාල සිය ශිෂ්‍යයන්ට ලබා දීමට අපේක්ෂා කරන්නේ මොනවාද ? 39

රාජ්‍ය විශ්වවිද්‍යාල සිය ශිෂ්‍යයන්ගෙන් පෙරලා කුමක් අපේක්ෂා කරන්නේද ? 41

# පෙරවදන

1978 අංක 16 දරන පණතින් ස්ථාපිත කරන ලද **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**, රජය සහ විශ්වවිද්‍යාල අතර අවරෝධකයක් සේ ක්‍රියා කරන ව්‍යස්ථාදායක හස්තය වන්නේ ය. එයට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නීති නියාමන කාර්යය සඳහා බලය ලබා දී ඇත්තේ ය.

තමා වෙත පැවරුණු බලාධිකාරි භූමිකාව සපුරනු වස් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශිෂ්‍ය ප්‍රඥප්තියක් පිළියෙල කළේ, විශ්වවිද්‍යාලයට ඇතුළත් වන ශිෂ්‍යයන්ට මාර්ගෝපදේශනයක් මෙන් ම විශ්වවිද්‍යාලය හා එහි ශිෂ්‍යයන් අතර පවත්නා කතිකාවෙහි කොන්දේසි පැහැදිලි කෙරෙන ලේඛනයක් වශයෙනි. එමෙන් ම මෙම ලේඛනය අධ්‍යයන, පරිපාලන, සහාය කාර්ය මණ්ඩලය සහ මහජනයාට ද මාර්ගෝපදේශනයක් වන අතර රාජ්‍ය විශ්වවිද්‍යාලවල බාධා රහිත පැවැත්ම සඳහා ආධාරී වන හැමගෙන් ම අපේක්ෂිත කැපවීමක් ද මෙමගින් අවධාරණය කෙරෙයි.

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය**

විශ්වවිද්‍යාලවල දැක්ම හා කාර්යලක්ෂයන් ද විශ්වවිද්‍යාලය පාලනය කරන මූලධර්මයන් ද, විශ්වවිද්‍යාලයට ඇතුළු වූ ශිෂ්‍යයකුට/ ශිෂ්‍යාවකට එහි දී ලැබිය හැක්කේ කවරාකාර අත්දැකීම් ද යන්න මෙමගින් පැහැදිලි කෙරෙයි.

- විශ්වවිද්‍යාල හා ශිෂ්‍යයා අතර පැවැතිය යුතු සම්බන්ධතාව පිළිබඳ කොන්දේසි පැහැදිලි කරයි.

- තෝරාගත් විෂය ක්ෂේත්‍රයන්ගෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමෙන් පසුව ඥාන ගවේෂණයෙහිලා ලබා ගත හැකි අවස්ථා පිළිබඳ ශිෂ්‍යයන්ට මඟ පෙන්වයි.

- ඵලදායි, නිර්මාණශීලී, වගකිවයුතු හා ප්‍රබුද්ධ අකාරයට මෙන් ම විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයටත්, ඔවුන්ගේ අනාගතයටත් හානිදායක නොවන ආකාරයට හැසිරීම පිළිබඳව ශිෂ්‍යයන්ට උපදෙස් දෙයි.

- පෙළඹවීම, අනුබලදීම මගින් විශ්වවිද්‍යාලයේ නීතිය හා සාමය කඩකිරීම නිසා ඇති වන විපාක පැහැදිලි කරයි.

- විශ්වවිද්‍යාලය මගින් සිදු කරනු ලබන විනයානුකූල ක්‍රියා පරිපාටිය මෙන් ම පොලීසිය හා අධිකරණය මගින් සිදු කරනු ලබන දණ්ඩනීය ක්‍රියා මාර්ග ද පැහැදිලි කරයි.

- විශ්වවිද්‍යාලය ඇතුළත තහනම් කරන ලද සදාචාර විරෝධී හා නීති විරෝධී ක්‍රියා කවරේදැයි පැහැදිලි කරන අතර ම,

- සදාචාර හා නීති විරෝධී කටයුතුවල යෙදීමෙන් හෝ එවැනි ක්‍රියා එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදු කිරීමේ දී පැනවිය යුතු දඬුවම් ද මෙහි දක්වනු ලබයි.

එබැවින් ජාතික විශ්වවිද්‍යාලවලට පැවරී ඇති බලඅධිකාරී භූමිකාව මගින් ආයතනීය ප්‍රතිපත්ති සහ සාරධර්ම සුරක්ෂා කිරීමටත්, පවත්වාගෙන යාමටත් සහයෝගය දක්වන ලෙස **ශිෂ්‍ය ප්‍රඥප්තිය** මහත් ඕනෑකමින් ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටියි.

# පළමු කොටස

## විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තියට හැඳින්වීමක්

### රාජ්‍ය විශ්වවිද්‍යාල පාලනය කෙරෙන මාර්ගෝපදේශක ප්‍රතිපත්ති

විවෘත භාවය

සාධාරණත්වය සහ විවිධත්වය

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ සමාජ සම්මුතීන් ආරක්ෂා කිරීම කෙරෙහි වන කැපවීම

### රාජ්‍ය විශ්වවිද්‍යාල භූමිකාව

ඉගැන්වීමේ හා ඉගැනීමේ විශිෂ්ඨ මධ්‍යස්ථාන

පර්යේෂණ සහ නවීකරණය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථාන

## විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තියට හැඳින්වීමක්

නිරන්තරයෙන් දේශයේ වර්ධනය වන මානව සම්පත් සංවර්ධන ඉල්ලුමට සරිලන ආකාරයේ නැණ නුවණැති තරුණ තරුණියන් නිෂ්පාදනය කිරීමට මෙන් ම උසස් අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන අයගේ ප්‍රාර්ථනා සම්පූර්ණ කිරීම ද, ඇතුළත් ව කාර්යද්වයයක් සිදු කිරීමට **රාජ්‍ය විශ්වවිද්‍යාල** කැපවී සිටියි. මෙම උතුම් කාර්යය සම්පූර්ණ කිරීමට ඔවුන් බලාපොරොත්තු වන්නේ, ඉහළ ගුණාත්මක අගයකින් යුතු අදාළ සහ විශිෂ්ට පිළිගැනීමකට ලක් වූ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහිත මාරු කළ හැකි තාක්ෂණික හැකියා ඇති විෂය පරාසයක් මගින් උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන ශිෂ්‍යයන් මාර්ගයෙනි. එමගින් සීමා රහිත ලෝක ගවේෂණය සඳහා තරුණ උපාධිධාරීන්ට සිය පූර්ණ සක්‍යතා සහ ප්‍රාර්ථනා සාක්ෂාත් කර ගැනීමට අසීමිත අවස්ථා සලසා දෙනු ලබන්නේය.

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය**

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය විසින් ජාතික විශ්වවිද්‍යාලවල දැක්ම සහ කාර්ය ලක්ෂය මෙන් ම විශ්වවිද්‍යාල පාලනය කෙරෙන පුළුල් ප්‍රතිපත්ති සංක්ෂේපයෙන් දක්වන අතර විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් බවට පත් වූ විද්‍යාර්ථීන්ට විශ්වවිද්‍යාලයෙන් ලැබිය හැකි අත්දැකීම් ආදිය ද පැහැදිලි කරනු ලබයි. විශ්වවිද්‍යාලය සහ ශිෂ්‍යයන් අතර පැවැතිය යුතු අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳව මෙන් ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සහ විශ්වවිද්‍යාල අතර පවත්නා කතිකාවතක් ලෙසට ද මෙය සැලකිය හැකි ය. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය අධ්‍යයන, පරිපාලන, සහායක කාර්ය මණ්ඩල සහ පොදු ජනයා ද සඳහා වන මාර්ගෝපදේශනයක් ද වන අතර එය ජාතික විශ්වවිද්‍යාලවල සුමට පැවැත්ම අපේක්ෂා කරන කැපවීමක් හා විශේෂ අවධානයකින් යුතු හැම දෙනෙකුට ම යළි යළිත් කරුණු පැහැදිලි කරන්නකි.**

ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය ස්ථාපිත හා එය පාලනය කෙරෙන නීතිමය රාමුව, උසස් අධ්‍යාපන ඇමැතිවරයා වෙත පවරා ඇති අධිකාරය සහ බලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල පාලක සභා, සනාතන සභා සහ පීඨ මණ්ඩල කටයුතු කරන ආකාරය පිළිබඳව සොයා බලන හා ඒ පිළිබඳව විශේෂ අවධානයක් ඇති අයට කෙරෙන මග පෙන්වීමක් ලෙසට ද සැලකිය යුත්තේය. (1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි ප්‍රතිපාදන

(www.ugc.ac.lk) සෑම ජාතික විශ්වවිද්‍යාලයක් මගින් ම වැදගත් තොරතුරු සපයන වෙබ් අඩවි පවත්වාගෙන යනු ලබයි. (උප ලේඛනයේ ලැයිස්තු ගත කොට ඇත.) පහත දැක්වෙන තොරතුරු ලබා ගැනීම සඳහා එම වෙබ් අඩවිවලට පිවිසෙන ලෙසට ශිෂ්‍යයන්ට උපදෙස් දෙනු ලැබේ.

- අධ්‍යයන වැඩ සටහන්
- නීති රීති සහ ක්‍රියා පරිපාටිය (විශ්වවිද්‍යාල දින දර්ශනය බලන්න)
- විශ්වවිද්‍යාලයේ පීඨ, සේවා මධ්‍යස්ථාන, ඒකක පිළිබඳ සංවිධානාත්මක ව්‍යුහය (විශ්වවිද්‍යාල අත්පොත සහ පීඨ පිළිබඳ නිර්දේශ විස්තර බලන්න.)
- පීඨ මගින් ඉදිරිපත් කරන උපාධි වැඩ සටහන් හා පාඨමාලා (පශ්චාද් උපාධි සහ උපාධි පාඨමාලා වැඩ සටහන් හෝ පාඨමාලා විස්තර බලන්න.)
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ හැසිරීම සහ විනය පාලනය කෙරෙන, විශ්වවිද්‍යාල මගින් පනවන ලද අතුරු ව්‍යවස්ථා (ශිෂ්‍ය විනය පිළිබඳ නීති රීති බලන්න.)

**රාජ්‍ය විශ්වවිද්‍යාලවල දැක්ම සහ කාර්යලක්ෂය**

රාජ්‍ය විශ්වවිද්‍යාලවල දැක්ම වන්නේ අධ්‍යයන හා අධ්‍යාපන කටයුතු, පර්යේෂණ පැවැත්වීම, දැනුම බෙදා හැරීම, පර්යේෂණ සහ පාණ්ඩිත්‍යය ප්‍රවර්ධනය කිරීම ආදී පරිපාලන සහ කළමනාකරණ කාර්යයන්හි විශිෂ්ට මධ්‍යස්ථාන බවට පත්වීමය.

මෙම දැක්ම අනුගමනයෙන් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම විවිධ විෂය ක්ෂේත්‍ර හා වෘත්තීන් පිළිබඳ අවධානයෙන් කටයුතු කරයි. යථෝක්ත ආයතනයන්හි උදාර කාර්යභාරය පිළිබඳ අවධාරණයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ සහ සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල පිළිබඳ පුරෝගාමියා වූ ශ්‍රීමත් අයිවෝ ජෙනිංග්ස් වරක් ප්‍රකාශ කළේ,

> **තමා වෙත පැවැරෙන ලෝකයේ කවර කාර්යයක් හෝ සම්පූර්ණ කිරීමට හැකියාව ඇති, උද්යෝගී, ප්‍රත්‍යුත්ක්‍රම ශක්තියෙන් යුතු, විනිශ්චය හා උපාය කෞශල්‍යයෙන් හෙබි නායකත්ව ගුණාංගයන්ගෙන් පරිපූර්ණ තරුණ තරුණියන් පුහුණු කිරීම විශ්වවිද්‍යාලයේ කාර්යය බවය.**
>
> - ශ්‍රීමත් අයිවෝ ජෙනිංග්ස්
>
> **(University of Ceylon Calander, 1947)**

මෙම කාර්යලක්ෂය සාක්ෂාත් කරගනු ලබන්නේ වැදගත් හර විෂය ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම හා ඉදිරිපත් කිරීම මෙන් ම හර විෂයයන් සේ නොසැලකෙන භාෂා, ප්‍රවෘත්ති, තොරතුරු තාක්ෂණය, වෘත්තීය සංවර්ධනය, කලාව හා සංස්කෘතිය ආදී විෂයයන් අධ්‍යයන පරිසරයට ගැළපෙන ප්‍රගුණ කර විය හැකි විෂය සංකලන හෝ 'මෘදු' හැකියා මගින් 'වැඩ ලෝකයේ' ඉහළ මට්ටමේ හැකියාවකින් යුතු පුද්ගලයකු බවට විශ්වවිද්‍යාල උපාධිධරයා පත් කිරීමෙනි. එයට අමතර ව විවිධ වයස් ප්‍රමාණවල ඥාන ගවේෂකයන්ට විශිෂ්ට අධ්‍යාපනයක් හා පුහුණු අවස්ථා මෙන් ම උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන්නන්ට පර්යේෂණ හා පාණ්ඩිත්‍යය, සාමාජික හා වාර්ගික සුහදතාව, යහපාලනය සහ කළමනාකරණය මෙන් ම සමාජ කැපවීම හා බලපෑම් හා බද්ධ ක්‍රියාවලියක් මගින් පොදු ජනයා වෙත ළඟා වීම ද මෙමගින් අපේක්ෂිතය.

## රාජ්‍ය විශ්වවිද්‍යාල පාලනය කෙරෙන මාර්ගෝපදේශක ප්‍රතිපත්ති

මූලික ජාතික ප්‍රතිපත්ති හා නිර්ණායක අනුව යමින් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම මෙහෙය වෙන්නේත් පාලනය කෙරෙන්නේත් විවෘත භාවය, සාධාරණත්වය, විවිධත්වය සහ ප්‍රජාතාන්ත්‍රිය පුද්ගල අයිතීන් හා ප්‍රජා සම්මුතිවලට ගැළපෙන පරිද්දෙනි. විශිෂ්ට අධ්‍යයන මධ්‍යස්ථාන බවට පත්වෙමින් අධ්‍යාපනය, අධ්‍යයනය, සෞන්දර්යාත්මක හා සංස්කෘතික අංශ පිළිබඳ ගවේශණ, පර්යේෂණ හා සංවර්ධනය මෙන් ම සමාජ කැපවීම හා බැඳුණු ක්‍රියාවලියක් මගින් පොදු ජනයා වෙත ළඟාවීම ද විශ්වවිද්‍යාලවල අපේක්ෂාව වන්නේය.

**විවෘත භාවය, සාධාරණත්වය, විවිධත්වය සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මෙන් ම සමාජ සම්මුතීන් සුරක්ෂණය උදෙසා වන කැපවීම.**

විශ්වවිද්‍යාල යනු ශාස්ත්‍රාභිලාශී විවිධ පරිණත ශිෂ්‍ය කණ්ඩායම් සඳහා උසස් අධ්‍යාපන කටයුතු වල නිරත වීමටත් නිර්මාණාත්මක කාර්යයන්හි උද්යෝගිමත් ව, ප්‍රබෝධයෙන් මෙන් ම සුසංවාදී ව කටයුතු කළ හැකි රක්ෂා ස්ථානයෝ වෙති. ඒ හැරුණු විට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සිවිල් සමාජයේ සම්මුතීන් ගරු කරන බවටත්, ඒවා අගයන බවටත් විශ්වවිද්‍යාලය සහතික වන අතර එයට ප්‍රතිචාර වශයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වගකිව යුතු පුරවැසියන් ලෙස සිවිල් සමාජය අපේක්ෂිත සෑම ආකාරයක සමාජ සම්මුතීන්ට අනුව සාමාජික හැඟීමෙන් යුතු පුරවැසියන් ලෙස කටයුතු කරනු ඇතැයි ද අපේක්ෂා කරයි.

**විවෘත භාවය :**

විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම පිළිබඳ තොරතුරු, අධ්‍යයන පාඨමාලා ඇගැයීමේ ක්‍රියාවලිය, බඳවා ගැනීමේ නිර්ණායක හා බඳවා ගැනීමේ ක්‍රමය මෙන් ම හිමිකම්, වරප්‍රසාද හා අවස්ථා ද ඇතුළු ව දුක් ගැනවිලිවලට පිළියම් සැපයීම සහ විනය හා සම්බන්ධ කාර්ය පරිපාටිය පිළිබඳව ද සියලු තොරතුරු සැපයීමට සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම බැඳී සිටී.

**සාධාරණත්වය හා විවිධත්වය**

වාර්ගික, ආගමික ලබ්ධිය, ප්‍රභවය වශයෙන් හා සමාජ ආර්ථික පසුබිම මත ශ්‍රී ලාංකික සමාජය විවිධත්වයෙන් යුතු බව රාජ්‍ය විශ්වවිද්‍යාල පූර්ණ වශයෙන් අවබෝධ කොට ගනියි. කිසිම ශිෂ්‍යයකු, ආචාර්ය


මණ්ඩලයේ සාමාජිකයකු, වයස් ප්‍රමාණය, ජාතිය හෝ වාර්ගික ප්‍රභවය, ආගමික ලබ්ධිය, විශ්වාස පද්ධතිය හෝ ජීවන දර්ශනය, ස්ත්‍රී පුරුෂ



සමාජභාවය, ආබාධිත භාවය, විවාහක අවිවාහක බව හෝ දෙමාපියන්ගේ තරාතිරම, ලිංගික දිශානතිය පදනම් කොට ඍජුව හෝ වක්‍රව අඩු සැලකිල්ලක් නො දැක්වීමට රාජ්‍ය විශ්වවිද්‍යාල හැමෙකක් ම සහතික වෙයි.

**ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ සමාජ සම්මුතීන් ආරක්ෂා කිරීම කෙරෙහි වන කැපවීම.**

ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිපත්ති සහ සමාජ සම්මුති ආරක්ෂා කිරීමට ප්‍රතිපාදන සපයන බවටත් පුද්ගල අයිතිවාසිකම් සහතික කරන බවටත් (අදහස් ප්‍රකාශනයේ අයිතිය, එක හා සමාන රුචියක් ඇති කණ්ඩායම් සංගම් පිහිටුවා ගැනීම, කිසිදු බාධාවකින් තොර ව අභිමානයෙන් හා ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත්වීම, පරිභවය, තර්ජනයෙන් බිය ගැන්වීම, පෞද්ගලිකත්වයට ඇති අයිතිය ආදිය) විශ්වවිද්‍යාලය තුළ සාධාරණ හා යුක්තිගරුක සමාජයක් පවත්වා ගෙන යෑමටත් (මත්ද්‍රව්‍ය, මධ්‍යසාර වැනි දේ, සිවිල් සමාජයේ පවතින ලිඛිත අලිඛිත නීති හා සම්මුතීන්ට පරිභව කිරීම හා අගෞරව කිරීම) සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම බැඳී සිටියි.



කාර්යලක්‍ෂයට අනුකූල ව අධ්‍යයනය, අධ්‍යාපනය, පර්යේෂණ සහ නවීකරණය මගින් විශිෂ්ට මධ්‍යස්ථාන බවට පත්වන්නට සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම උත්සුක වෙයි.

**ඉගැන්වීමේ සහ ඉගෙනීමේ විශිෂ්ඨ මධ්‍යස්ථාන**

විවිධ වයස් කණ්ඩායම්වලට අයත් දැනුම අපේක්ෂා කරන්නන්ට, පර්යේෂණාත්මක චින්තනයක් ඇත්තවුන්ට, ස්වාධීන චින්තකයන්ට, ජනමත නිර්මාණය කරන්නන්ට, සංස්කෘතික හා සාහිත්‍යයික විද්වතුන්ට මෙන් ම නිර්මාණාත්මක දෘශ්‍ය හා ප්‍රාසාංගික කලා මාධ්‍යයන්හි රක්ෂා ස්ථාන වීමට රාජ්‍ය විශ්වවිද්‍යාල උත්සුක වෙයි. රාජ්‍ය විශ්වවිද්‍යාලවල සම්පත්වලින් ඉහළ ම ප්‍රමාණයක් යොදවනු ලබන්නේ ඉගැන්වීමේ සහ පුහුණු කිරීමේ සුසංයෝගයෙන් අධ්‍යයන පාඨමාලා සැලසුම් කොට වර්ධනය කිරීමටත්, ඉගැන්වීම් හා පුහුණු කිරීමට අදාල මූලාශ්‍ර, ක්‍රම වේදය හා මෙවලම් සැපයීමට මෙන් ම අධ්‍යයන හා පුහුණු කාර්යයන්ට අදාළ එකිනෙකට ගැළපෙන විවිධ පාඨමාලා සහ මොඩියුල ඉදිරිපත් කිරීමටත් ය.

අධ්‍යයන වැඩ සටහන්වල ගුණාත්මක වර්ධනය හා අදාළභාවය පිළිබඳ සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ ඇති ජාතික තත්ත්ව සහතික සහ ප්‍රතීතන කොමිසම (National Quality Assurance and Accreditation Council) වෙත සිය අධ්‍යයන වැඩසටහන් මෙන් ම ආයතනික විස්තර පුනරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය වෙයි. මෙ මගින් සෑම අධ්‍යයන වැඩ සටහනක් ම අනුගමනය කළ යුතු තත්ත්ව සහතිකයේ මූලික අංගවන විෂය පිල් ලකුණු (Bench Marks) බාහිර විමර්ශන, ජාතික විශ්වශ්‍යතා සුදුසුකම් රාමුව වැනි ව්‍යවස්ථා සහ ව්‍යවහාර සමග ගැළපෙන්නේ ද යන්න සොයා බැලීමට අවස්ථාව සැලසෙයි.

ශ්‍රම වෙළඳ පොළ ප්‍රවණතා, අවශ්‍යතා, මූලික හා අවශේෂ හැකියා මෙන් ම උපාධිධාරි ගුණාත්මක භාවය අරභයා සේවා දායකයන්ගේ අදහස් පිළිබඳ නිරන්තර තක්සේරුවක රාජ්‍ය විශ්වවිද්‍යාල නිරත වන්නේය. තව ද අදාළ විෂය ක්ෂේත්‍රයන්හි ජාතික හා ගෝලීය වශයෙන් සිදුවන අභිවර්ධන මෙන් ම තරුණ නිර්මාණාත්මක, උද්යෝගී අදහස්වලට ගැලපෙන සේ අදාළ විෂය ක්ෂේත්‍රයන්හි අභිවර්ධනය, සහ පැන නැඟෙන රැකියා අවස්ථා සහ වෙළඳපොළ පිළිබඳ ව සියලු ම පීඨ හා අධ්‍යයන අංශ සුපරීක්ෂාකාරී වන්නේ ය.

එබැවින් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම ආචාර්යවරුන් සංවර්ධනය කිරීම් හා අධ්‍යාපනික තාක්ෂණික මධ්‍යස්ථානවලින් සමන්විත ව



ඇත්තේ ආචාර්යවරුන් සඳහා නව අධ්‍යාපන ව්‍යවහාර, ක්‍රම වේද පුහුණුවීම්, මෙවලම් සහ ශිල්පීධර්ම මගින් සහභාගී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම හා ඉගැන්වීම පිළිබඳ සුසංගත භාවයක් ඇතිවන පරිද්දෙනි. නිරතුරුව ම අධ්‍යයන වැඩ සටහන් විවිධාංගීකරණය කරනු ලබන්නේ උපාධි අපේක්ෂකයන් යාවජීව අධ්‍යයනයෙහි යෙදෙන්නන් බවට පත් කිරීමේ අරමුණු ඇති ව සෑම පීඨයක් ම විෂය මාලා සංවර්ධන ඒකකයකින් සමන්විත වන ආකාරයට ය.

උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන හැමට ම අධ්‍යයන පහසුකම් සැපයීමේ අරමුණින් රාජ්‍ය විශ්වවිද්‍යාල විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා ඉදිරිපත් කොට තිබේ. අර්ධකාලීන පාඨමාලා ඉදිරිපත් කොට ඇත්තේ දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන සහ අඛණ්ඩ හෝ විවෘත සහ දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන හෝ බාහිර විභාග අංශ මගිනි. විශ්වවිද්‍යාලයට ඇතුළුවීම සඳහා වන සුදුසුකම්, පූර්ණකාලීන හෝ අර්ධකාලීන පාඨමාලාවලට ඇතුළත්වීමට අදාළ සුදුසුකම්, විශේෂ උපාධි පාඨමාලා, විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා අයැදුම්පත් ඉදිරිපත් කරන ආකාරය ආදී තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කොට ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි (www.ugc.ac.lk) දක්වා ඇත්තේය. සෑම ශිෂ්‍යයකුට ම පොදු නිර්ණායකයන් හා ප්‍රමිතීන්ට අනුව එක ම ආකාරයේ අවධානයකින් හා ඇගැයීමකින් කටයුතු කරන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහතික වෙයි. විශේෂිත උපාධි පාඨමාලා පිළිබඳ තොරතුරු ඒ ඒ විශ්වවිද්‍යාලවල වෙබ්අඩවිවලට පිවිසීමෙන් ලබා ගත හැකිය. දේශන හා සාකච්ඡාවාර, ප්‍රායෝගික පන්ති, ක්ෂේත්‍ර අධීක්ෂණ, සායනික හා කාර්මික ස්ථානගත කිරීම් ආදී අධ්‍යයන වැඩ සටහන් බොහොමයකට සහභාගි වීම ශිෂ්‍යයන්ට අනිවාර්ය වන්නේය. පාඨමාලාවෙහි ඉහළට යෑම සඳහා සෑම ශිෂ්‍යයකු ම අවම වශයෙන් සඳහන් කොට ඇති ශ්‍රේණිගත සාමාන්‍ය පවත්වා ගත යුතුය. අවම අවශ්‍යතා සපුරා ගත නොහැකි වූ අයට අනුග්‍රාහී අවස්ථා ලබා දෙන අතර අවම ශ්‍රේණිගත සාමාන්‍යය ලබා ගැනීමට නොහැකි වීම ශිෂ්‍ය භාවය අහෝසි වීමට හේතු වන්නේ ය. ජාතික වශයෙන් අදාළ භාවයක් මෙන් ම ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් ඇති පළමු උපාධිය ජාතික විශ්වවිද්‍යාලවල මූලික ඉලක්කය



වුව ද, තෝරා ගත් හර උපාධි පාඨමාලා සමග හර සේ නොසැලකෙන අතිරේක පාඨමාලා සඳහා ද සැහෙන පහසුකම් සලසා ඇත්තේය. හර විෂය ලෙස නොසැලකෙන එවැනි අධ්‍යයන ඒකක ඉදිරිපත් කොට ඇත්තේ ඉංග්‍රීසි භාෂා දැනුම හා හැකියා වැඩි දියුණු කිරීමට හා ශක්තිමත් කිරීමටත්, තොරතුරු තාක්ෂණික දැනුම හා හැකියා වර්ධනයටත්, නිර්මාණාත්මක හැකියා මෙන් ම තවත් කෙනෙකුව ප්‍රගුණ කරවිය හැකි සේ සැලකෙන විවිධත්වයෙන් යුතු අන්තර් පුද්ගලයීය සහ සමාජ හැකියා වර්ධනයටත්, සංස්කෘතික හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හා රසඥතාව වර්ධනය කිරීමත් අරමුණු කොට ගෙනය.

**පර්යේෂණ සහ නවීකරණය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථාන**

නව දැනුමේ මධ්‍යස්ථාන ලෙස රාජ්‍ය විශ්වවිද්‍යාල සැලකෙන බැවින් සියලු උපාධි අපේක්ෂකයන්, පශ්චාද් උපාධි අපේක්ෂකයන් මෙන් ම ආචාර්ය මණ්ඩලය දැඩි ව උනන්දු කෙරෙන්නේ නව ප්‍රවණතා, නව දැනුම, නව අදහස් සහ සාරධර්ම ගවේෂණය සඳහා ය. උපාධි අපේක්ෂක මට්ටමේ සිට පශ්චාද් උපාධි මට්ටම් දක්වා පර්යේෂණ කටයුතු කෙරෙහි ශිෂ්‍යයන් යොමු කරවන අතර බොහොමයක් උපාධි පාඨමාලාවලට පර්යේෂණ සංරචක ද ඉදිරිපත් කොට ඇත්තේ ය. මෙම අධ්‍යයන අභ්‍යාස මගින් ගවේෂණශීලී ශිෂ්‍යයන්ට අන්තර් දෘෂ්ටියක් සපයනු ඇත. පශ්චාද් උපාධි මට්ටමේ දී අධ්‍යයන පාඨමාලා වෙනුවට පර්යේෂණ උපාධි වන Msc (විද්‍යාපති), MPhil (දර්ශනපති) Ph.D (දර්ශන විශාරද) උපාධි කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙයි. රාජ්‍ය විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලවල බහුතරයක් ඔවුන්ගේ පශ්චාද් උපාධි පුහුණුව ලබා ගෙන ඇත්තේ ලොවෙහි ඉතා ගෞරවයට පාත්‍ර වූ විශ්වවිද්‍යාලවලිනි. එමෙන්ම ඔවුහු, ඔවුන්ගේ පර්යේෂණ හා සංවර්ධන කාර්යය සඳහා ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමට සමත්ව සිටිති. එසේ ම ආචාර්ය මණ්ඩලවල බහුතරයක් විද්වත් වෘත්තීය සංවිධාන සහ සංගම්වල සාමාජිකත්වය ලැබූවෝ වෙති. ඔවුහු සිය පර්යේෂණ පත්‍රිකා ජාතික හා අන්තර්ජාතික වශයෙන් විශිෂ්ට සඟරාවල පළ කරති. කාර්මික හා වෘත්තීය පාඨමාලා සමග සම්බන්ධ නොවන හා මානවශාස්ත්‍ර පීඨවලට සම්බන්ධ ආචාර්යවරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සමකාලීන ආර්ථික, සාමාජික හා දේශපාලනික මෙන් ම සාහිත්‍යය හා සංස්කෘතිය ආදී විෂයයන් පිළිබඳ ව සිය දැනුම හා දැක්ම පොදු ජනයා සමග බෙදා ගනිති.

**උසස් අධ්‍යාපනය සඳහා වූ**

# විශිෂ්ඨ මධ්‍යස්ථාන

# දෙවන කොටස

## ශාස්ත්‍රීය පරිසරය සහ ශිෂ්‍ය ආධාරක සේවා

නේවාසික පහසුකම්

සෞඛ්‍ය සේවා

ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය

පුස්තකාල සේවා

තොරතුරු සන්නිවේදන සේවා

වෘත්තීය මාර්ගෝපදේශන සේවා

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන

ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම්

බහු සංස්කෘතික මධ්‍යස්ථාන

ශිෂ්‍ය සහායක සහ සුහසාධක ජාලය

## ශාස්ත්‍රීය පරිසරය සහ ශිෂ්‍ය ආධාරක සේවා

ශිෂ්‍යයන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ පූර්ණ විභවතා වර්ධනය වන ආකාරයේ ශාස්ත්‍රීය පරිසරයක් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මගින් ම සකසා ඇත්තේය. ශිෂ්‍යසේවා සහ පොදු පහසුකම් වශයෙන් ප්‍රමිතියකින් යුතු පහසුකම් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මගින් ම සපයන අතර එම පහසුකම්වල ගුණාත්මකභාවයේ වෙනසක් ඇති විය හැක්කේ ඒවායෙහි පිහිටීම හා පරිණත භාවය වශයෙනි. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කුසලතා, ප්‍රවෘත්ති සහ සන්නිවේදන තාක්ෂණික කුසලතා, පුද්ගලාන්තර කුසලතා, ව්‍යවසායක සහ නායකත්ව කුසලතා, සමාජ චාරිත්‍ර, පෞරුෂ ගති ලක්ෂණ ආදී වශයෙන් උපාධි අපේක්ෂකයන්ට අනුපූරක සහ ප්‍රගුණ කරවිය හැකි විෂය ගොණුවක් ඉගැන්විය හැකි අධ්‍යයන මධ්‍යස්ථාන සහ වැඩ සටහන් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ම ඇත්තේය. ජාතික විශ්වවිද්‍යාල බොහොමයක ශිෂ්‍යයන් සඳහා විශේෂ වූ ආධාරක සහ උපකාරක සේවා පිහිටුවා ඇත්තේ විවිධ අවශ්‍යතා හෝ දක්ෂතා ඇති ශිෂ්‍යයන් සඳහා වන අතර එම පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීමට විශ්වවිද්‍යාල කටයුතු කරමින් සිටී.

**නේවාසික පහසුකම් :**

ස්ථාවර වූ සහ අභිනවයෙන් පිහිට වූ, කොළඹින් බැහැර පිහිටි විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් සඳහා නේවාසික පහසුකම් සලසා ඇත්තේය. කොළඹ ආශ්‍රිත ව පිහිට වූ විශ්වවිද්‍යාල මගින් සීමිත නේවාසික පහසුකම් සලසා ඇත්තේ විශ්විද්‍යාලයට පිටතින් ප්‍රමාණවත් නේවාසික පහසුකම් සපයා ගත හැකි බැවිනි. කිසියම් ශිෂ්‍යයකු සඳහා විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයක නේවාසික පහසුකම් සැලසෙන්නේ නම් එහි පදිංචි කාලය තුළ ශිෂ්‍යයා, ගෙවිය යුත්තේ නියමිත නාම මාත්‍රික ගාස්තුවක් පමණි. එවැනි අවස්ථාවක දී ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයේ නේවාසික අධිකාරිය සමග විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය. ස්වයංසේවා ආපනශාලා පහසුකම්, නේවාසික පහසුකම්වලට ඇතුළත් වන අතර සමහර අවස්ථාවක දී සිය ආහාරපාන පිළියෙල කර ගන්නා අය සඳහා පහසුකම් ද සලසා ඇත්තේය.

**සෞඛ්‍ය සේවා :**

සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් තුළම සෞඛ්‍ය සත්කාර, විශේෂ සෞඛ්‍ය සත්කාර සහ හදිසි සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන පිහිටුවා ඇත්තේය. විශේෂ සෞඛ්‍ය සත්කාර හෝ හදිසි සෞඛ්‍ය සේවා අවශ්‍ය අවස්ථාවක දී එම විශේෂ සේවා අවශ්‍ය ශිෂ්‍යයන් ළඟම ඇති රජයේ රෝහලට යොමු කරනු ලැබේ.

**ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය :**

විශ්වවිද්‍යාල ආරක්ෂක සේවාව මගින් ශිෂ්‍යයන් සඳහා සුරක්ෂිත වාතාවරණයක් සැපයීමට විශ්වවිද්‍යාලය සහතික වෙයි. තව ද විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන මාෂල්වරුන් සහ විනය කටයුතු භාර නිලධාරීන් ශිෂ්‍යයන්ගේ විනය පිළිබඳ ව සුපරීක්ෂාකාරී ව සිටිනු ඇත.

**පුස්තකාල සේවා :**



සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම සෑහෙන ප්‍රමාණයකට පොත් තැන්පත් කොට ඇති ප්‍රධාන පුස්තකාලයට අමතර ව විවිධ පීඨවල ද පුස්තකාල ශාඛා ඇති කොට තිබේ. මෙම පුස්තකාලවල අදාළ විෂය ක්ෂේත්‍ර සඳහා වූ විශිෂ්ට මුද්‍රිත කෘති එකතු දක්නා ලැබේ. බොහොමයක් පුස්තකාලවල සේවා ස්වයංක්‍රීය මෙන් ම සංඛ්‍යාංක ගත කොට ඇති බැවින් විමර්ශන කටයුතු සඳහා තොරතුරු සපයා ගැනීම අතිශය පහසු වෙයි. ඒ හැරුණු විට පුස්තකාල කාර්ය මණ්ඩලය සෑම අවස්ථාවක ම ශිෂ්‍යයන්ට උදව් කිරීමට සහ මෙහෙය වීමට ද කැපවී සිටිති.

**තොරතුරු සන්නිවේදන සේවා :**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රධාන මධ්‍යස්ථානයක් සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම සතු ව ඇත්තේය. මෙම මූලික පහසුකමට අමතර ව සෑම පීඨයකමත් ඒ හා අදාළ පරිගණක ඒකක ද තිබේ. මෙම මධ්‍යස්ථාන මගින් ශිෂ්‍යයන්ට මෙන් ම සෑම පීඨ සාමාජිකයකුට ම, කොටසකට ම, මධ්‍යස්ථානයකට ම, ඒකකයකට ම අයත් ප්‍රාදේශීය සම්බන්ධතා ජාලය අන්තර්ජාලය හා සමග සම්බන්ධවීමට පහසුකම් සලසා ඇත. එම සෑම කොටසක් ම, මධ්‍යස්ථානයක් ම, ඒකකයක් ම තොරතුරු තාක්ෂණ අධ්‍යාපන සහ තාක්ෂණික සම්පත් මධ්‍යස්ථාන ලෙස පීඨ මගින් ඉදිරිපත් කරන අධ්‍යාපනික වැඩ සටහන් ඉදිරිපත් කිරීමේ අතිරේක සේවයක් සිදු කරනු ලැබේ. තොරතුරු මධ්‍යස්ථාන බොහොමයක් සහතික පත්‍ර සහ ඩිප්ලෝමා මට්ටමේ පුහුණු පාඨමාලා

සැලසුම් කොට අභ්‍යන්තර සහ බාහිර ශිෂ්‍යයන් සඳහා ඉදිරිපත් කරන අතර ම ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් සඳහා විද්‍යුත් e-ඉගෙනුම් පහසුකම් හෝ වෙබ් අඩවි පදනම් කොටගත් අධ්‍යයන සම්පත් සහ සේවා ආචාර්ය මණ්ඩලයට මෙන් ම ශිෂ්‍යයන්ට ද සපයනු ලැබේ.

**වෘත්තීය මාර්ගෝපදේශන සේවා :**

පූර්ණ හෝ අර්ධකාලීන වෘත්තීය මාර්ගෝපදේශකවරුන් සහ උපදේශකවරුන්ගෙන් සමන්විත වෘත්තීය මාර්ගෝපදේශන ඒකක සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම පිහිටුවා ඇත්තේය. මෙම වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මගින් පුළුල් අධ්‍යයන වැඩ සටහන් මාලා මෙන් ම උපාධි අපේක්ෂකයන්ට 'වැඩලෝකය' සඳහා වන අවස්ථා හා මාර්ගෝපදේශ ලබා දෙයි. මෙමගින් පාසලේ සිට විශ්වවිද්‍යාලයට ඇතුළුවන තරුණ ශිෂ්‍යයකුගේ / ශිෂ්‍යාවකගේ සංක්‍රාන්තිය පහසු කිරීම අරමුණු කොට ගෙන අධ්‍යාපනික හා වෘත්තීය උපදේශන සේවා සැපයීම, රැකියාවකට සුදුසු හැකියා ලබා ගැනීමට අවස්ථාව සැලසීම, ව්‍යවසායකත්ව හැකියා, පෞරුෂ සංවර්ධන වැඩ සටහන්වලට සහභාගීවීම, වෘත්තීය හා අදාළ තොරතුරු සැපයීම සහ උපාධිධාරීන් සඳහා රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ රැකියා පහසුවෙන් සොයා ගැනීමට අවශ්‍ය වෘත්තීය හෝ ස්වයං රැකියා ඇරඹීමට අවස්ථාව සැලසෙන්නේය.

**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩ සටහන :**

තරගකාරී ලෝකයේ සාර්ථකත්වයක් අපේක්ෂා කිරීමට ජාතික භාෂාව හැරුණු විට ඉංග්‍රීසි සහ වෙනත් විදේශීය භාෂා ඉගෙනීම හා ඒ පිළිබඳ අවශ්‍ය ප්‍රවීණත්වය ලබා ගැනීම අතිශයින් ම වැදගත් වන්නේය. සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකක (ELTU) සහ ඉංග්‍රීසි වැඩ සටහන් ව්‍යාප්ත කොට ඒ අංශවල භෞතික, මානව සම්පත් හා ධාරිතා වර්ධනය කොට ඇත්තේය. අධ්‍යයන වැඩ සටහන් බහුතරයකට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ඇතුළත් වන අතර එම පාඨමාලා අනිවාර්ය වන්නේය. එමෙන් ම උපාධිය ලැබීමට පෙර අදාළ ඉංග්‍රීසි පාඨමාලාව පිළිබඳ ව ප්‍රවීණත්වයක් ද දැක්විය යුතු වන්නේය.

**ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම් :**

උපාධි අපේක්ෂකයන්ට මෙන් ම ආචාර්ය මණ්ඩලයට ද අත්‍යවශ්‍ය සේවා සපයන ස්වයංසම්පූර්ණ සාමාජික හා කෘත්‍යාත්මක ඒකක සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම ඇත්තේය. ඒ හා අදාළව නිරෝගී මනස් සහ ශක්ති සම්පන්න දේහ ප්‍රවර්ධනයට අනුබල දීමේ අරමුණින් සෑම ජාතික විශ්වවිද්‍යාලයක ම ක්‍රීඩා හා විශ්‍රාන්ති සඳහා පූර්ණ පහසුකම් සලසා ඇත්තේය. සමහර විශ්වවිද්‍යාලවල සෑම අංශයකින් ම සමන්විත අභ්‍යන්තර ක්‍රීඩාගාර ඇති අතර තවත් සමහරක් විශ්වවිද්‍යාලවල උපදේශක සැසිවාරවල සිට දීර්ඝ වන, සේවා සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර, ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා ද පවත්වනු ලැබේ. ක්‍රීඩා සහ විශ්‍රාන්ති අවස්ථා පහසුකම් සැපයීම හැරුණු විට විශ්වවිද්‍යාල බහුතරයක ක්‍රීඩා පිළිබඳ වෘත්තීය මට්ටමේ පුහුණුව මෙන් ම උපදේශනය ද ලබා දෙන්නේ අන්තර් විශ්වවිද්‍යාලයීය හා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රිඩාතරග සඳහා ය.

**බහු සංස්කෘතික මධ්‍යස්ථාන :**

ශ්‍රී ලංකා සමාජයෙහි දක්නට ලැබෙන බහුවාර්ගික ස්වභාවයට අනුගත ව සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ම සියලු ම සාමාජික, සංස්කෘතික, වාර්ගික සහ ආගමික පසුබිම්වලට අයත් ශිෂ්‍යන්ට විවෘතව පවතී. විවිධ සාමාජික, සංස්කෘතික, වාර්ගික හා ආගමික පසුබිම්වලින් පැමිණි ශිෂ්‍යයන්ට ඔවුනොවුන් අතර සංසක්තභාවය හා සුසංගමය ඇති කිරීමට රාජ්‍ය විශ්වවිද්‍යාල අනුබල දෙනු ලැබේ. විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන කාලය තුළ ශිෂ්‍යයන්ගේ ජීවිත සැප පහසුවෙන් ගත කිරීමට අවස්ථාව සලසන අතර ම, සමාජය වෙනස් කිරීමේ නියෝජිතයන් ලෙස උපාධි අපේක්ෂකයන් ලබා ගන්නා අත්දැකීම් හේතුවෙන් මුළු මහත් සමාජය කෙරෙහි සාමාජික හා වාර්ගික සුසංගමය ඇති කොට ව්‍යාප්ත කිරීමට අනුබල දීම ද රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කරයි. විශ්වවිද්‍යාල මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියට අනුබල දෙන උත්ප්‍රේරක මධ්‍යස්ථාන ලෙස සැලකිය යුතු අතර මෙම සන්දර්භය යටතේ මේ වන විටත් ජාතික විශ්වවිද්‍යාලවල බහුතරයක් බහුසංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සැලසුම් කිරීම හා අනුබල දීම කරනු ලබන්නේ එමගින් වඩා වැදගත් සමාජ හා වාර්ගික සංසක්ත භාවයක් සහ සුසංගමයක් විවිධ වාර්ගික හා සාමාජික කණ්ඩායම් අතර ඇති කිරීම සඳහාය.

**ශිෂ්‍ය සහායක සහ සුභසාධක ජාලය :**

විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම හා අදාළ ප්‍රශ්න, නේවාසික පහසුකම් සහ වෙනත් අත්‍යවශ්‍ය සේවා සඳහා සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම වෙනම ම පරිපාලන සහ සේවා මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත්තේය. සමහර විශ්වවිද්‍යාලයක පිහිටුවා ඇති ශිෂ්‍ය සහායක සේවා සහ වෙනත් සම්බන්ධීකාරක කටයුතු සුභසාධක අධ්‍යක්ෂවරයකු, සම්බන්ධිකාරකවරයකු යටතේ පවත්වා ගෙන යනු ලබයි. සෑම විශ්වවිද්‍යාලයක ම භෝජනාගාර සේවා, සිල්ලර හෝ වෙනත් අත්‍යවශ්‍ය භාණ්ඩ වෙළඳ සැල්, තැපැල් කාර්යාල, අන්තර්ජාල සේවා, ඇඳුම් මහන ස්ථාන, කරණවෑමිහල් ආදිය පිහිටුවා ඇත්තේ විශ්වවිද්‍යාල වටපිටාව තුළ ශිෂ්‍යයන්ට සෑම පහසුකමක් ම සැපයෙන පරිද්දෙනි.

සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම සංස්කෘතික මධ්‍යස්ථාන, පරිසර අධ්‍යයන, නාට්‍ය, සංගීත ආදී විවිධත්වයකින් යුතු සංගම් පිහිටුවා ඇත්තේ උපාධි අපේක්ෂකයන් සඳහා නිර්මාණාත්මක හා විශ්‍රාන්තිමය ක්‍රියාකාරකම් සඳහා අවස්ථා සැලසීමට ය. විෂය මාලාවට අයත් නැති එවැනි ක්‍රියාකාරකම් සහ වැඩ සටහන් ශිෂ්‍යන් අතර මෙන් ම ආචාර්යවරුන් හා විවිධ වාර්ගික කණ්ඩායම් අතරත් සංසක්ත භාවය හා සුසංගමය ඇති කිරීමට අනුබල දෙයි. ඒ හැරුණු විට ශාස්ත්‍රීය ගවේෂණය සඳහා අතිශයින් වැදගත් වන සෞන්දර්යාත්මක වශයෙන් සුපෝෂණීය පරිසරයක් නිර්මාණය කිරීමට සෑම විශ්වවිද්‍යාලයක් ම ප්‍රයත්න දරයි.

# තෙවන කොටස

## රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාලන විධිය සහ කළමණාකරණය

ශිෂ්‍යභාවය ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රතිපත්ති

ප්‍රකාශන නිදහස

ශිෂ්‍ය නියෝජන

ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය

පෞද්ගලික අයිතිය

විනය පවත්වා ගෙන යෑම

නීතිය හා සාමය ආරක්ෂා කිරීම

## රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාලන විධිය හා කළමනාකරණය

රාජ්‍ය විශ්වවිද්‍යාල ස්ථාපිත කොට, ව්‍යුහගත කොට පාලනය කරනු ලබන්නේ කලින් කලට සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණත මගින් පවරණ ලද ව්‍යවස්ථාවන්ට අනුගතවය. ස්වකීය මූලික කාර්යයන් පාලනය කිරීමට, සැලසුම් කිරීමට, විධිමත්ව සකස් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ සේවා සැපයීම මෙන් ම දුක්ගැනවිලිවලට පිළියම් යෙදීමට, ශිෂ්‍යන්ගේ හා ආචාර්යවරුන්ගේ විනය පවත්වා ගෙන යෑමට සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ම බල අධිකාරිය පවරා ඇත්තේ ය. විශ්වවිද්‍යාල පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන පිරිසට ප්‍රතිචාර දැක්විය හැකි, ප්‍රතිඵල අපේක්ෂාවෙන් කටයුතු කරන නිලධාරීන් මගින් සිදු කරන සහ වගකිව යුතු කළමනාකරණයක් සෑම විශ්වවිද්‍යාලයක් ම සතුව ඇත්තේය. එසේ වූ කල ආයතනයේ විධි නියෝගයන්ට අනුකූල දැක්ම හා කාර්ය ලක්‍ෂයට අනුව ආයතනයේ සම්පත් (මානව හා භෞතික සම්පත් තාක්ෂණය හා වත්කම් ආදිය) උපරිමයෙන් භාවිතය සඳහා යොදා ගත හැකිවෙයි.

විශ්වවිද්‍යාල, දේශයේ විවිධ ක්ෂේත්‍රයන්හි අනාගතය හැඩ ගස්වන අනාගත නායකයන් පුහුණු කරන විශිෂ්ට මධ්‍යස්ථාන බව රාජ්‍ය විශ්වවිද්‍යාල සපුරා අවබෝධ කොට ගෙන ඇති අතර ම රාජ්‍ය ආයතනවල ආදර්ශ භූමිකාව ලෙස කටයුතු කිරීම ද ඒවා සතු වැදගත් කාර්යයකි. අවාසනාවකට මෙන් පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල ප්‍රතිරූපයට බරපතල හානි සිදු ව ඇත්තේය. මෑත කාලයේ දී විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විසින් රාජ්‍ය ආයතන ඔවුන් වෙත පවරන ලද නිදහස අනිසි සහ වැරදි ලෙස භාවිත කිරීමේ හේතුවෙන් අසල්වැසි ආසියානු රටවල් සමග සැසඳීමේ දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ අභිවර්ධනයට එම සිද්ධි අහිතකර ලෙස බලපාන ලද්දේය. එවැනි විරෝධතා සිදු කරන ලද්දේ දේශපාලන වශයෙන් උසිගන්වන ලද අතළොස්සක් ශිෂ්‍යයන් මගින් බව පැහැදිලිය. උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනීමේ සිද්ධි, ශිෂ්‍යයන් සඳහා වන පහසුකම්වලට බාධා පැමිණ වීම්, දේපලවලට හානි සිදුකිරීම් ද, මනුෂ්‍ය ඝාතන ඇතුළු ජීවිතවලට හානි සිදුකිරීම වැනි සිද්ධි විශ්වවිද්‍යාලවලින් වාර්තා වී තිබිණ. රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට මෙවැනි පිළිකුල් සහගත සහ විනාශකාරී සිද්ධි වැළැක්වීමේ වගකීම දරන්නට සිදුවීම නිසා, ආයතනික සැලසුම් කිරීම්, ඒවා ක්‍රියාවේ යෙදවීම් සහ අධීක්ෂණ කටයුතු කෙරෙහි අවශ්‍ය අවධානය යොමු කළ නොහැකි ව ඇත්තේය. දේශපාලන අරමුණු ඇති බාහිර බලවේග මගින් මෙහෙය වන අතලොස්සක් පමණ වන ශිෂ්‍යයන්ගේ වගකීමෙන් තොර කටයුතු හේතුවෙන් සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව ම අපහාසයට පත්වීමත් එහි ප්‍රතිඵල වශයෙන් සිදුවන විනාශකාරී බලපෑම විශ්වවිද්‍යාල පාලකයන්ට පමණක් නොව ශිෂ්‍යයන් කෙරෙහි ද යොමු වන්නේය. මේ බව හොඳින් ම පැහැදිලි

වන්නේ පෞද්ගලික අංශයේ රැකියා සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන් බඳවා ගැනීමේ දී සේවාදායකයන් විසින් දක්වනු ලබන ප්‍රතිචාර මගිනි. උපාධිධාරීන්ට වඩා නුපුහුණු අ.පො.ස (උ.පෙ) සමත් ශිෂ්‍යයන් ප්‍රවේශ මට්ටමේ රැකියා සඳහා පෞද්ගලික අංශයට බඳවා ගැනීමට ඔවුහු වැඩි කැමැත්තක් දක්වති. මේ හේතුව නිසා සෑම අනුයාත රජයකට ම විරැකියා උපාධිධාරීන් සඳහා මෙතෙක් නොපැවැති අඩුවැටුප් සහිත අතෲප්තිමත් රැකියා නිර්මාණය කිරීමට සිදු ව ඇත්තේය.

එබැවින් මෙහි සඳහන් කොට ඇති ආකාරයට, විශ්වවිද්‍යාලයේ සුමට පැවැත්ම තහවුරු වන සේ නීති රීති පිළිපැදීමටත් විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය රැක ගන්නා ලෙසටත්, අවසන් වශයෙන් සිය ආදරණීය දෙමාපියන්ගේ ප්‍රාර්ථනා සම්පූර්ණ කිරීමට බාලකාලයේ සිට ඔබ තුළ තිබූ ජීවිතයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන ආකාරයටත් කටයුතු කරන ලෙස විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට තරයේ අවවාද කරන්නෙමු.

**ශිෂ්‍ය භාවය ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රතිපත්ති:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ නියෝග මත විශ්වවිද්‍යාලයට ඇතුළු වන අපේක්ෂකයන් අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් ලියාපදිංචි කරනු ලැබේ. නිසැකව ම ඔවුහු ලියාපදිංචි වූ විශ්වවිද්‍යාලයේ ම පාඨමාලා හැදෑරිය යුත්තෝය. එසේ විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර අපේක්ෂකයන් ලෙස ලියාපදිංචි වූ ශිෂ්‍යයන්ට වෙනත් විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචියට අවස්ථාවක් නොලැබේ. එක් විශ්වවිද්‍යාලයක සිට තවත් විශ්වවිද්‍යාලයකට මාරුවීම සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බැලෙන්නේ විශේෂ අවස්ථා යටතේ පමණි. ලියාපදිංචි වූ පාඨමාලාවෙන් ඉල්ලා අස්වීම ධෛර්යමත් නොකෙරන අතර එවැන්නක් මගින් සිදුවන්නේ රාජ්‍ය සම්පත් මෙන් ම සුදුසුකම් ලද ශිෂ්‍යයන්ට ලැබෙන වටිනා අවස්ථාවක් නිකරුණේ අපතේ යැවීමකි. ඒ හැරුණු විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සිහින දකින සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් වැළැක්වීම ද එමගින් සිදුවෙයි.

**ප්‍රකාශන නිදහස :**



සෑම විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගේ ම ප්‍රකාශන නිදහස තහවුරු කොට ඇත්තේය. එබැවින් ශාස්ත්‍රීය කටයුතු, පරිපාලන සහ

සුභසාධක ප්‍රශ්න මෙන් ම දේශපාලනික, සාමාජික ප්‍රශ්න සහ තේමා පිළිබඳ ව අදහස් ඇති කොට ගැනීම හා ඒවා පිළිබඳ ප්‍රකාශ කිරීමට ද ශිෂ්‍යයන්ට අනුබල දෙනු ලැබේ. එසේ ද වුවත් එවැනි ප්‍රකාශන පුද්ගලයකුට එල්ලවන ප්‍රහාර හෝ පුද්ගලයන් ඉලක්ක කර ගැනීම වැනි තත්ත්වයකට නොයා යුතුය. එසේ කළ යුතු වන්නේ, සෙසු අය අමනාප කොට නොගෙන මතවාද ඇති කොට ගැනීමටත් සිය අදහස් ප්‍රකාශනයට හැමට ම අයිතියක් ඇති නිසාත්ය.

**ශිෂ්‍ය නියෝජන :**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව සමහර තීරක මට්ටම්වල දී ශිෂ්‍ය නියෝජන සහතික කොට ඇත්තේය. සුභසාධක කටයුතු, සමහර පරිපාලන සහ ශාස්ත්‍රීය ස්වභාවයේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් ශිෂ්‍ය නියෝජිතයන් මගින් ශිෂ්‍යයන්ට අදහස් ඉදිරිපත් කළ හැකිය. පීඨ සභා, ආහාර සහ භෝජනාගාර, ආරක්ෂක, නේවාසික, ක්‍රීඩා, ආරක්ෂක කමිටු මෙන් ම විශ්වවිද්‍යාල මගින් සංවිධානය කරනු ලබන විවිධ යථායෝග්‍ය කටයුතුවලට ද ශිෂ්‍ය නියෝජිතයන් සහභාගී විය යුතු ය.

**ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය :**

කලින් කලට සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය තහවුරු කොට ඇත්තේය. පෞද්ගලික අපේක්ෂාවන්ගෙන් හෝ දේශපාලන අරමුණුවලින් වියුක්ත ශිෂ්‍ය සංවිධාන, කණ්ඩායම් හෝ සමාජ පිහිටුවා ගැනීමේ අයිතිය ශිෂ්‍යයන්ට ලබා දී ඇත්තේය. එමෙන් ම නිදහස් මතධාරීව හෝ කිසිම සංගමයකට නොබැඳී හෝ සිටීමට ශිෂ්‍යයන්ට ඇති අයිතිය ද තහවුරු කොට තිබේ. ශිෂ්‍ය සංවිධාන හෝ සංගම් නිර්මාණය කරන ශිෂ්‍යයෝ ශිෂ්‍යයන්ගේ පෞද්ගලික 'තෝරා ගැනීමේ අයිතියට' ගරු කළ යුත්තාහ. ස්වාධීන ව සිටීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන්ගේ නිදහසට බාධා කරන ශිෂ්‍යයන්ට එසේ නොකරන ලෙස අනතුරු හඟවනු ලැබේ.

**පෞද්ගලික හැසිරීම :**

විශ්වවිද්‍යාලයට අයත් සෑම සාමාජිකයකුට ම ආයතනයේ ගරුත්වය හා එහි සාමාජිකයන්ගේ ආත්මසම්මානය පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබිය යුතුය. එබැවින් එහි සෑම නිවැසියෙකු ම එහි කාර්යලක්ෂයට ගැලපෙන පරිදි හැසිරිය යුතුය. ඔවුන් හැම දෙනෙකු ම සිය පෞද්ගලික ස්වස්ථතාව, ආචාර සමාචාර, ඇඳුම් ආයිත්තම් හෝ

කථාබහ ආදිය පිළිබඳ සවිඥානක විය යුතුය. කිසි ම ශිෂ්‍යයකු තවත් ශිෂ්‍යයකුගේ හෝ විශ්වවිද්‍යාල සමාජයේ සාමාජිකයකුගේ සිත් නොරිදවිය යුතුය. එමෙන් ම තමන් කැමැති ආකාරයට ඇඳුම් ආයිත්තම් පැළඳීමටත් ඔවුන්ගේ සංස්කෘතික අපේක්ෂාවනට හා තමාගේ කැමැත්තට අනුව ආහාරපාන ගැනීමටත් ඔවුන්ට නිදහස ඇති බව සිහිතබා ගත යුතුය. ශිෂ්‍යයන් තමාගේ ක්‍රියාවෙන් හා වචනයෙන් විනීත විය යුතු අතර ම හැම කෙනෙකුට ම සුසංවාදී ව ජීවත්වීමට ඉඩදිය යුතුය. අපහාසාත්මක ක්‍රියා, පොදු අනර්ථකාරී ක්‍රියා වැළැක්වීමේ නීතිවලට මෙන් ම විශ්වවිද්‍යාලයේ විනය නීතිවලට අනුව ද දඬුවම් ලැබිය හැකි වැරදි වන්නේය.

**විනය පවත්වාගෙන යෑම, නීතිය හා සාමය ආරක්ෂා කිරීම :**

අනාගත නායකයන් පුහුණු කිරීම හා හැඩගැස්වීම, විශිෂ්ට මධ්‍යස්ථාන වන විශ්වවිද්‍යාලවල කාර්යය වන්නේය. එබැවින් එහි නිවැසියන් සිවිල් සමාජයේ සම්මත හා ව්‍යවහාරයනට අනුව වගකිව යුතු හා අභිමානවත් ආකාරයට හැසිරිය යුතුය. තව ද ඔවුහු විශ්වවිද්‍යාල මගින් පනවන ලද නීතිරීතීන්ට ද අනුගත විය යුත්තාහ. සෑම විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගෙන් ම ඉහළ ම සදාචාරවත් හැසිරීමක් අපේක්ෂා කෙරේ. විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය ආරක්ෂා කිරීමත්, සදාචාර විරෝධී, දුරාචාරවත්, නීති විරෝධී සහ විශ්වවිද්‍යාලයට අපකීර්තියක් ගෙන දෙන, එමෙන් ම වෙනස් කළ නොහැකි සේ තම අනාගතය අනතුරට පත් කරන කටයුතුවල නොයෙදීම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කෙරේ. විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අවනත නොවීම සහ රටේ සහ ආයතනයේ නීතිය හා සාමය කැඩීමට හේතුවන විනාශකාරී හැසිරීම් සිදුකළ හොත් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා වන අතුරු නියෝග හා සම්බන්ධ විනයානුකූල ක්‍රියා මාර්ග විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීමට සිදුවන්නේය. ඒ හැරුණු විට රටේ නීතියට අනුව, වරදකරුවන් රටේ පවත්නා නීතිය ක්‍රියාත්මක කරන්නා වූ පොලීසියට භාර දීමට විශ්වවිද්‍යාල අධිකාරියට සිදු වන්නේය. ශිෂ්‍යයන් විසින් නොකළ යුතු සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියාවන්හි ප්‍රතිඵල වශයෙන් විෂමාචාරය සඳහා වරදකරුවන් වුවහොත් ශිෂ්‍යයන් මුහුණ දිය යුතු විපාක පහතින් දක්වා ඇත.



## සිව්වන කොටස

**විශ්වවිද්‍යාලය තුළ තහනම් කොට ඇති සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියා**

වෙනත් කෙනෙකුගේ නිර්මාණයක් තමාගේ සේ දැක්වීම සහ වංචා කිරීම

කළහකාරී හැසිරීම, විසම්මිතිය සහ විරෝධතා දැක්වීම

ගරුසරු නැති බව (අවිනීත බව) සහ අවනත නොවීම

භාණ්ඩ සේවා සහ තොරතුරු නීති විරෝධී ලෙස භාවිත කිරීම

අනවසර මුදල් එකතු කිරීම

සම්ප්‍රයාචනය

මද්‍යසාර මත්ද්‍රව්‍ය සහ දුම්කොළ විශ්වවිද්‍යාල භූමිය තුළ දී සන්තකයේ තබා ගැනීම සහ පරිභෝජනය

සූදුව

හිරිහැර කිරීම/ප්‍රචණ්ඩභාවය

මානසික වදහිංසාව/නවකවදය

ලිංගික අතවර කිරීම

සොරකම

හිතාමතා හෝ ද්වේශසහගතව දේපළ විනාශ කිරීම/ හානි කිරීම

අනවසරයෙන් ඇතුළුවීම

බලධාරීන්ට සහාය වීම

අභියාචනා අයිතිය

## විශ්වවිද්‍යාලය තුළ තහනම් කොට ඇති සදාචාර විරෝධි සහ නීති විරෝධී ක්‍රියා

සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයක ම ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලයේ විනයානුකූල ක්‍රියාවන්ට හෝ පොලීසිය හෝ අධිකරණයක් මගින් දඬුවම් ලැබිය හැකි සදාචාර විරෝධී හෝ නීති විරෝධී ක්‍රියාවලින් වැළකී සිටිය යුත්තෝ වෙති.

අධ්‍යාපන ආයතනවල නවක වධය හෝ වෙනත් ආකාර වූ පහත් ප්‍රචණ්ඩ ක්‍රියා නැවැත්වීමේ 1998 අංක 20 දරන පණත මගින් එවැනි වරදකරුවන්ට එරෙහි ව උසාවිය මගින් දඬුවම් කරවීමට පොලීසියට බලය ලබා දී ඇත්තේය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2010 ජනවාරි 15 වැනිදා නිකුත් කළ චක්‍රලේඛයට අනුව විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනවල නවක වධය පිටු දැකීම සඳහා සදාචාර විරෝධි හා නීති විරෝධි කිසියම් ක්‍රියාවකින් වැරදිකරන අයවලුන්ට එරෙහි ව ගත යුතු දැඩි පියවර පනතින් ලැයිස්තු ගත කොට ඇත. තවද, 2008 දෙසැම්බර් 1 වෙනිදා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිකුත් කරන ලද අංක 902 දරන චක්‍රලේඛයට අනුව ද විශ්වවිද්‍යාල දේපළවලට හානි කිරීමට වගකිව යුත්තන්ගෙන් අලාභය අය කර ගැනීමට හෝ ශිෂ්‍ය සමිති හා සංගම්වලට වෙන් කළ මුදලින් එම අලාභය පියවා ගත හැකිය. විශ්වවිද්‍යාල මගින් පනවනු ලබන දඬුවම්, අලාභය අයකර ගැනීම සහ/ හෝ තාවකාලික පන්ති තහනමක් සඳහා අනතුරු හැඟවීමේ ලිපියක සිට විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් තහනම් කිරීම සහ විශ්වවිද්‍යාලයෙන් නෙරපීම දක්වා දිගු විය හැකි අතර එම දඬුවම් පනවන්නේ උසාවියකින් දෙනු ලබන දඬුවමට අමතරව ය.

**1. වෙනත් කෙනෙකුගේ නිර්මාණයක් තමාගේ සේ දැක්වීම සහ වංචා කිරීම.**

සිය ශාස්ත්‍රීය කටයුතුවල දී මෙන්ම විභාග කටයුතුවල දී ද ඉහළ ශාස්ත්‍රීය අවංක භාවයක් මෙන් ම ප්‍රමිතියක් ද පවත්වාගෙන යෑම සෑම උපාධි අපේක්ෂකයකුගෙන් ම අපේක්ෂිත ය. වෙනත් අයකුගේ නිර්මාණයක්, පිළිතුරක් වංචනික ලෙස පිටපත් කිරීම, විභාගවල දී අනවසර ලිපි ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, වෙනත් අයකුගේ පිළිතුරු, වාර්තා සහ නිබන්ධ හෝ නිබන්ධිකාවල එන තොරතුරුවල මූලාශ්‍ර හෙළි නොකිරීම තහනම් වන්නේය. මෙම තහනම නොතකා හරින්නන්ට එරෙහිව විනයානුකූල පියවර ගනු ලැබේ. තමාගේ ම කෘතියක් ඉදිරිපත් කිරීමේ දී ද ඒ සඳහා යොදා ගත් කෘති/ තොරතුරු පිළිබඳව විධිමත් ආකාරයට කෘතඥතාව පළ කළ යුතු වන්නේ ය.



**2. කළහකාරි හැසිරීම්, විසම්මිතිය සහ විරෝධතා දැක්වීම.**

සදාචාරය පිළිබඳ සමකාලීන සමාජ ප්‍රමිතීන් සහ විශ්වවිද්‍යාලයීය ධර්මතා උල්ලංඝනය කිරීම විශ්වවිද්‍යාලය නොඉවසයි. මණ්ඩපය හෝ විශ්වවිද්‍යාලය මගින් අනුග්‍රහය දක්වන කටයුත්තක දී හෝ එයින් පිටත සිදු කරනු ලබන එවැනි කටයුත්තක දී සිදු කරනු ලබන කිසිදු නීති විරෝධී ක්‍රියාවක්, නොහික්මුණු හෝ අශෝභන ක්‍රියාවක් විශ්වවිද්‍යාලය නොඉවසයි. සිවිල් නීතියට හෝ විශ්වවිද්‍යාල නීතිරීතිවලට පටහැනි සංවිධාන කටයුතු කිරීම්, අනුග්‍රහ දැක්වීම්, ක්‍රියාත්මක කිරීම්, වැඩ සටහන් මෙහෙයවීම් හෝ ක්‍රියාකාරකම් හා සම්බන්ධ කළහකාරී සහ/ හෝ නීති විරෝධී ලෙස බලය පාවිච්චි කිරීම් තහනම් වන අතර එවැනි ක්‍රියා විනයානුකූල ක්‍රියා මාර්ගයන්ට යටත් වන්නේ ය.

**3. ගරුසරු නැති බව (අවිනීත බව) සහ අවනත නොවීම.**

විශ්වවිද්‍යාල නිලධාරීන්ට විශ්වවිද්‍යාලය මගින් පනවා ඇති නියෝගවලට අනුකූලව රාජකාරි ඉටු කිරීමේ දී ඒවාට අවනත නොවීම තහනම් වන්නේය. එවැනි අවස්ථාවල දී ගනු ලබන විනයානුකූල ක්‍රියාමාර්ග පහත සඳහන් ක්‍රියාවනට පමණක් සීමා වන්නේ නොවේ.

1. අපවාදාත්මක හෝ නින්දා සහගත භාෂා භාවිතය.
2. අශෝභන සහ නොමනා අභිනය/ ඉඟි භාවිතය.
3. විශ්වවිද්‍යාල බලධාරියකුගේ සාධාරණ ඉල්ලීමකට ගරුසරු නොදැක්වීම හෝ ප්‍රතික්ෂේප කිරීම.
5. හමුවීමට නියම කළ වේලාවට නොපැමිණීම ඇතුළු ව විශේෂ වූ කාල පරාසය තුළ කරනු ලැබූ සාධාරණ ඉල්ලීමකට ප්‍රතිචාර නොදැක්වීම.
6. සිතාමතා සහ දැනුවත් ව අධ්‍යාපන කටයුතුවලට බාධා පැමිණ වීම.
7. කිසියම් සිද්ධියක් පිළිබඳ පරීක්ෂණයකට බාධා කිරීම සහ වැළැක්වීම.

**4. භාණ්ඩ සේවා සහ තොරතුරු නීති විරෝධී ලෙස භාවිත කිරීම.**

විශ්වවිද්‍යාලය සහ මහජනයා සමග කටයුතු කිරීමේ දී අවංකකම සහ සත්‍යවාදීබව ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කෙරේ.

ශිෂ්‍යයන් සහ ඔවුන්ගේ අමුත්තන්ට පහත සඳහන් ක්‍රියා තහනම්ය.

1. වෙනත් කෙනෙකුගේ හෝ කණ්ඩායමකගේ අවසරයකින් තොරව කිසියම් දේපොළක් අයත් කර ගැනීම හෝ අවසරයකින් තොරව කිසියම් සේවාවක් සිදු කිරීම.

2. පොදු මුදල් වංචා කිරීම, රැවටිල්ලෙන් අලාභ සිදු කිරීම හෝ වංචාවෙන් මුදල් ලබා ගැනීම, කපටිකමින් මුදල් හෝ සේවා ලබා ගැනීම.

3. වංචා කළ හෝ සොරකම් කළ බව දැන දැන ම දේපොළ මුදල් හෝ සේවා සන්තකයේ තබා ගැනීම හෝ මිළ දී ගැනීම.

4. ගෙවීම් සඳහා ඉදිරිපත් කළ විට එය අගරු වන බව දැන දැනම විශ්වවිද්‍යාලයට ගෙවීමක් හෝ ලැබිය යුත්තක් වෙනුවෙන් චෙක් පතක් නිකුත් කිරීම.

5. විධිමත් අවසරයකින් තොර ව එක හා සමාන යතුරු, පරිගණක ප්‍රවේශ හෝ වෙනත් උපක්‍රම භාවිතය.

6. කූට රචනය, වෙනස් කිරීම හෝ පරිපාලන වාර්තාවකට වැරදි තොරතුරු ඇතුළත් කිරීම හෝ එවැනි තොරතුරු පරිපාලන හෝ විනයානුකූල ක්‍රියා පරිපාටියක දී ඉදිරිපත් කිරීම.

7. අවසරයකින් තොර ව පරිගණක පද්ධතිය හෝ පරිගණක ප්‍රවේශ කේත භාවිතය හෝ පරිගණක සේවා පරිසීමිත ප්‍රදේශය පරිහරණය කිරීම.

8. ව්‍යාජ හැඳුනුම්පතක් භාවිතය හෝ ළඟ තබා ගැනීම.

9. විශ්වවිද්‍යාලයෙන් අවසර ලැබූ පුද්ගලයකු හැර වෙනත් කෙනෙකු යතුරු සහ / හෝ වෙනත් උපක්‍රම (අංක කේත හෝ sweep cards ආදිය) සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම හෝ ඒවා භාවිතයෙන් කාර්යාල, දෙපාර්තමේන්තු, රසායනාගාර, පීඨ

ගොඩනැගිලිවලට හෝ නේවාසිකාගාර කාමරවලට හෝ ඇතුළු වීම.



**5. අනවසර අරමුදල් එකතු කිරීම.**

ශිෂ්‍ය සංවිධානයක් මගින් හෝ බලධාරියකු මගින් විශ්වවිද්‍යාල අරමුණක් සඳහා අරමුදල් සම්ප්‍රයාචනය කිරීම සිදු කළ යුත්තේ උපකුලපතිවරයාගේ විධිමත් අවසරයක් යටතේය. අනුග්‍රාහකත්වය හෝ අරමුදල් අපේක්ෂවෙන් බැහැරින් කෙරෙන ඉල්ලීමක් සිදු කළ යුත්තේ උපකුලපතිවරයාගේ අනුමැතිය සහ අත්සන සහිත ලිපියක් මගිනි. එවැනි අවසරයකින් තොර ව දේශපාලන අරමුණු සඳහා හෝ පුණ්‍යායතනයකට සම්බන්ධ ව හෝ සාමාජික ක්‍රියාවක් සඳහා විශ්වවිද්‍යාලයේ දී හෝ පිටත දී හෝ කටයුතු කිරීමට අවසර නැත.

**6. සම්ප්‍රයාචනය**

උපකුලපතිවරයාගේ අවසරයකින් තොර ව පිටත්තර පුද්ගලයකු, සංවිධානයක් හෝ කාර්යයක් සඳහා සම්ප්‍රයාචනය නොකළ යුතුය. රැස්වීම් පැවැත්වීම, කවරාකාරයක හෝ පත්‍රිකා බෙදා හැරීම හෝ ප්‍රසිද්ධ ස්ථානයක දැන්වීම් ප්‍රදර්ශනය, භාණ්ඩ හෝ සේවා හුවමාරුව සහ නිමේයය භාණ්ඩ හෝ සේවා විකිණීම මෙයට ඇතුළත් වෙයි.



**7. මධ්‍යසාර, මත්ද්‍රව්‍ය සහ දුම්කෙළ විශ්වවිද්‍යාල භූමිය තුළ දී සන්තකයේ තබා ගැනීම සහ පරිභෝජනය.**

මිනිස් මනස මත්කොට මානව හැඟීම් වෙනස් කරන එමෙන් ම ඔවුන්ගේ මානසික හා කායික ශක්‍යතා නොමග යවන මධ්‍යසාර, මත්ද්‍රව්‍ය හෝ දුම්කොළ ආදී වූ ද්‍රව්‍ය පරිභෝජනය ශ්‍රී ලාංකික සමාජය අනුමත නොකරයි. එබැවින් මධ්‍යසාර, මත්ද්‍රව්‍ය සහ දුම්කොළ විශ්වවිද්‍යාලය භූමිය තුළ දි සන්තකයේ තබා ගැනීම හා පරිභෝජනය තහනම් කිරීම සඳහා විශ්වවිද්‍යාලය ක්‍රියාමාර්ග පද්ධතියක් අනුගමනය කරනු ලබයි. මධ්‍යසාර හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනයෙන් පසු ව ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල භූමියට ඇතුළුවීම අනුමත කරනු නොලැබේ.




**8. සූදුව**

විශ්වවිද්‍යාල භූමිය තුළ සූදුව සඳහා අවසර නොලැබේ. කවරාකාරයක හෝ ඔට්ටු ඇල්ලීම, ඔට්ටු පිළිගැනීම හෝ කවරාකාර වූ හෝ ඔට්ටු ඇල්ලීමේ කූටෝපායයන්ට අවසර නොලැබේ. කිසියම් ශිෂ්‍යයකු/

ශිෂ්‍යයන් සුදුවේ යෙදී සිටිය දී අල්වා ගතහොත් රටේ නීතිය සහ විශ්වවිද්‍යාලයේ නීතිරීති අනුව දඬුවම් කරනු ලැබේ.



## 9. හිරිහැර කිරීම/ප්‍රචණ්ඩභාවය

කිසියම් පුද්ගලයකු හෝ කණ්ඩායමක් විශ්වවිද්‍යාලයේ ඇතුළත හෝ පිටත හෝ ප්‍රචණ්ඩ භාවය ඇති කිරීම, හිරිහැර කිරීම විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අනුව මෙන් ම සිවිල් නීතිය යටතේ ද එවැනි ක්‍රියාවක් සිදු කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි.

1. කිසියම් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට තර්ජනය කිරීම, ශාරීරික පීඩා සිදු කිරීම.

2. භීෂණකාරී කටයුත්තක යෙදීම හෝ කලබල කිරීමෙන් ශාරීරික තුවාල ඇති කිරීමේ හේතුවෙන් පුද්ගලයකු තුළ හෝ කණ්ඩායමක් තුළ මානසික චිත්තවේගී කම්පනයක් ඇති කිරීම හෝ දේපලවලට අලාභ හානි සිදු කිරීම.

3. පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් තැති ගැන්වීම හෝ තර්ජනයෙන් පෙළඹවීම.

4. පුද්ගලයන්ට කරදර කිරීම හෝ ඔවුන් කුපිත කරවීම.

5. දුරකථන, තැපැල් හෝ පරිගණක විද්‍යුත් තැපෑල හෝ වෙනත් සංනිවේදන මාධ්‍ය මගින් හිරිහැර කිරීම.




විශ්වවිද්‍යාල පීඨ සාමාජිකයන් පරිපාලන නිලධාරීන් හෝ ශිෂ්‍ය පිරිසකට එරෙහි ව ඍජුව හෝ වක්‍ර ව විශ්වවිද්‍යාලය අතුළත දී හෝ පිටත දී කෙරෙන හිංසන කටයුතු ඉහත සඳහන් කරුණුවලට පමණක් සීමා නොවේ. ඉහත සඳහන් කවාරකාර වූ හෝ හිරිහැර කිරීම්/ ප්‍රචණ්ඩ භාවය පිළිබඳව අදාළ පැමිණිලි නීති කටයුතු සඳහා පොලීසියට යොමු කරන අතර ම උපකුලපතිවරයා විසින් පත්කරනු ලබන විනය මණ්ඩලයක විනය පරීක්ෂණ කටයුතු සඳහා ද ඒවා යොමු කළ හැකිය.

## 10. මානසික වධ හිංසාව/නවක වදය

විශ්වවිද්‍යාල යනු ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රාප්තිය සඳහා වන ක්ෂේම භූමි වන්නේ ය. ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රාප්තිය සඳහා බාධකයක් වන නවකවදය හා මානසික වදහිංසාව ශිෂ්‍යයන්ගේ නිදහස හෝ ස්වාධීනත්වය ලඝුකොට විනාශ කොට ඇත්තේය. 1998 දී

පාර්ලිමේන්තුව සම්මත කරන ලද නවක වධ විරෝධී පනතට අනුව නවකවදය නීතියෙන් තහනම් ය. අවාසනාවකට මෙන් විශ්වවිද්‍යාලවල



සිටින අසාමාන්‍ය මානසික තත්ත්වය, හීනමානය මෙන් ම විනාශකාරී දේශපාලන ව්‍යාපාර හේතුවෙන් රැවටීමට පත් පුද්ගලයන් විසින් කරනු ලබන තාඩන පීඩන බොහොමයක් ජාතික විශ්වවිද්‍යාල තුළ සිදුවෙයි. ඇත්ත වශයෙන් ම නවකවදය සිදු කරන්නන් සමහර දේශපාලන ක්‍රියාකාරීන් විසින් අනුගමනය කරනු ලබන දේශපාලන උපක්‍රමශීලී බළල් අත් විය හැකිය. කිසියම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් කරනු ලබන කායික, මානසික, භාවමය හෝ මනෝවිද්‍යාත්මක ක්‍රියාවක් ස්වේච්ඡාවෙන් හෝ බලාත්කාරයෙන් හෝ කරනු ලැබීමක් මගින් කිසියම් පුද්ගලයකුට, විශ්වවිද්‍යාලය ඇතුළත දී හෝ පිටත දී බැනීම, නරක ආකාරයට සැලකීම පිළිකුලට භාජන කිරීම, මානසික වධ හිංසාව, තැති ගැන්වීම ආදී වශයෙන් කරනු ලබන ඕනෑම ක්‍රියාවක් නවකවදය යනුවෙන් අර්ථ නිරූපණය කළ හැකි වෙයි. මෙවැනි ක්‍රියා සිදු කිරීම තහනම් වන අතර ඒවා පහත දැක්වෙන කරුණුවලට පමණක් සීමා නොවේ.

1. බලාත්කාරකමින් පුද්ගලයන්ට අවමානයක් හෝ නින්දාවක් සිදු කෙරෙන ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීම හෝ එවැන්නක යෙදී සිටීම.

2. පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායමක් තම ශක්තිය හෝ බලය පෙන්වා බිය වැද්දවීම, බලයෙන් නම්මවා ගැනීම හෝ පොළඹවා ගැනීමට උත්සාහ කිරීම.

3. අධික ලෙස ශාරීරික හෝ මානසික වෙහෙසට පත් කිරීම.

4. ශාරීරික හෝ මානසික වශයෙන් කම්පනයට පත් කිරීම.

5. අශෝභන හෝ ඉස්මතුව පෙනෙන/ කැපී පෙනෙන ඇඳුම් ඇඳීමට බල කිරීම.

6. සදාචාරමය වශයෙන් නින්දා සහගත හා අවමානාත්මක ක්‍රියා, ක්‍රීඩා හෝ කාර්යයන්හි යෙදීමට පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායමකට බල කිරීම.

7. අධ්‍යයන කටයුතුවලට බාධාවන පරිදි සිවිල් සමාජයේ සම්මුතීන්ට පටහැනි වන ආකාරයට පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායමකට අළුයම හෝ අපර සන්ධ්‍යා කාලයේ යම් යම් කාර්යයන්ට යෙදීමට බලකිරීම.

8. විශ්වවිද්‍යාලයේ කාර්යලක්ෂයට අහිතකරවන පරිදි හා එහි ප්‍රතිපත්තිවලට එකඟ නොවන, එහි කීර්තිභාවයට අගෞරව වන

පරදි පුද්ගලයන්ගේ සිරුරුවල සලකුණු යෙදීම, පාට ගෑම හෝ එවැනි වෙනත් ක්‍රියා සිදු කිරීම.

*විශ්වවිද්‍යාලය තුළ තහනම් කොට ඇති සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියා...*

1998 දී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද නවක වධ විරෝධී පනතට අනුව, ඉහත සඳහන් ආකාරයේ ක්‍රියා පිළිබඳව ලැබෙන පැමිණිලි අදාළ නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය සඳහා පොලීසියට ඉදිරිපත් කරන අතර, විශ්වවිද්‍යාලය මගින් ද නිසි විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත. කිසියම් ආකාරයක නවක වධය හා වද හිංසා පිළිබඳව විශ්වවිද්‍යාලය තුළ නීතිය හා සාමය ඇති කිරීම සඳහා දැඩි පියවර ගන්නා ලෙස දන්වමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යම් යම් මෙහෙයුම් නිර්ණායක සහ චක්‍රලේඛ මේ වන විටත් නිකුත් කොට ඇත්තේය.




## 11. ලිංගික අතවර කිරීම්

සාමාන්‍ය වශයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව ගැහැනු පිරිමි වශයෙන් මිශ්‍ර ව සැදුනකි. සදාචාරාත්මක හා ආචාරධර්මමය වශයෙන් මිස ලිංගික ව හැසිරීමේ නිදහස ප්‍රායෝගිකව සීමා කළ නොහැක. එසේ වුවත් මිනිසා තුළ කා වැදී ඇති සියලු සදාචාරමය, ආචාරධර්මමය, ආගමික වටිනාකම් නොතකා බලාත්කාරයෙන් තම සිතැඟි පරිදි සෙසු අයට ලිංගික අතවර කිරීම හා ක්‍රියා සිදුකරන පුද්ගලයෝ සිටිති. විශ්වවිද්‍යාල පරිපාලනය යටතේ කිසියම් පුද්ගලයකු ලිංගික අතවර කිරීමක් හෝ ලිංගික අවකල් ක්‍රියාවක් සිදු කළේ නම් හෝ විරෝධය නොතකා සිය ලිංගික ආශා සන්තර්පණයට සමලිංගික හෝ විරුද්ධලිංගික පුද්ගලයකු යොදා ගන්නේ නම් හෝ ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ලැබුණු පසු වැරදිකරුවාට දඬුවම් කිරීම සඳහා පවතින නීතිය යටතේ ක්‍රියා කරනු ඇත.

## 12. සොරකම

භෞතික භාණ්ඩ මෙන් ම බුද්ධිමය දේපොල (වෙනත් අයකුගේ නිර්මාණයක්/ අදහසක්, වෙනත් අයකුගේ පර්යේෂණ හා නව නිර්මාණ තමාගේ සේ දැක්වීම ආදිය), අස්පර්ශනීය වත්කම් ආදිය සොරකම් කිරීම සිවිල් නීතිය යටතේ මෙන් ම විශ්වවිද්‍යාලයීය විනය ක්‍රියාමාර්ග යටතේ දී ද දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි ක්‍රියාවකින් දඬුවම් ලබන පුද්ගලයාට එරෙහි බලපෑම ඔහුගේ රැකියා කාලයට ම මෙන් ම ජීවිත කාලයට ම ද අවාසිදායක විය හැකිය. එබැවින් බුද්ධිමය දේපල මූලාශ්‍ර උපුටා ගැනීමේ දි විනිවිද භාවය ප්‍රදර්ශනය කිරීම මෙන් ම

එවැනි උපුටාගත් තැන් සඳහන් කිරීමට අවංක වන මෙන් ද ශිෂ්‍යයන්ට අනතුරු හඟවනු ලැබේ.



**13. හිතාමතා හෝ ද්වේශ සහගතව දේපල විනාශ කිරීම/හානි කිරීම.**

විශ්වවිද්‍යාලයේ දේපොල හිතාමතා හෝ ද්වේශ සහගතව හෝ විනාශ කිරීම/ හානි කිරීම හෝ එසේ කිරීමට සෙසු පුද්ගලයන් පෙළඹවීම, පොදු හෝ පෞද්ගලික දේපොල පිළිබඳ නීතිය යටතේ මෙන් ම විශ්වවිද්‍යාල නීති රීති යටතේ ද දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි ක්‍රියා සිදුකරන පුද්ගලයන් වරදකරුවන් බවට ඔප්පු වුවහොත් පන්ති කාමර ගෘහ භාණ්ඩ, නේවාසික ගෘහ භාණ්ඩ, රසායනාගාර උපකරණ, පරිගණක සහ උපාංග, ක්‍රීඩාභූමි උපකරණවලට සිදු කළ හානිය/ විනාශය ඔවුන්ගෙන් අයකර ගනු ලැබේ. ශිෂ්‍ය උද්ඝෝෂණ හේතුවෙන් දේපල විනාශ කිරීමකදී/ හානි කිරීමක දී ආදේශක ගාස්තු හා වන්දි මුදල් වගකිවයුත්තන්ගෙන් අයකර ගනු ලබන අතර හුදකලා සිද්ධිවල දී එම දේපලවල පදිංචියට හෝ භාවිතයට නීතිමය වශයෙන් බලය ලැබූ ශිෂ්‍යයන් වගකිව යුතු අතර, ඔවුහු අලාභ හානි සඳහා හානිපූරණය කළ යුත්තෝ වෙති.

**14. අනවසරයෙන් ඇතුළුවීම**

විශ්වවිද්‍යාලවල සම්පත් පරිහරණය කරන පුද්ගලයන් සඳහා පරිසීමා පණවා ඇත්තේය. සාමාන්‍ය වශයෙන් වැඩ කරන කාලය තුළ පන්තිකාමර, පුස්තකාල, ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස පුහුණු ශාලා ආදියට අවසරයකින් තොර ව ඇතුළුවීමට ශිෂ්‍යයන්ට ඉඩ සලසා ඇත්තේය. ශිෂ්‍යයන්ට ඔවුන්ගේ නේවාසිකාගාරවලට අවසරයකින් තොර ව ඇතුළුවිය හැකි අතර ශාලාධිපතිගේ අවසරයකින් තොර ව අමුත්තන්ට ඒවාට ඇතුළු විය නොහැකි ය. එසේ ම ආරක්ෂක කටයුතු ආදී විවිධ හේතු නිසා සමහර පොදු ප්‍රදේශවලට ඇතුළුවීමටද තහනම් නියෝග පැනවිය හැකිය. වෙනත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු තමා අයත් නැති විශ්වවිද්‍යාලයකට ඇතුළු වීමේ දී විශ්වවිද්‍යාල දෙකෙහි ම බලධාරීන්ගෙන් අවසර ලබා ගත යුතුය. එසේ නොමැති ව අනවසරයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළුවන්නන් රටේ පොදු නිතිය යටතේ දඬුවම් ලැබීමකට යටත් විය හැකි අතර විශ්වවිද්‍යාලයීය විනය පරීක්ෂණයකට ද යටත් විය යුතුය.

**15. බලධාරීන්ට සහාය වීම සහ විනය පර්යේෂණ කමිටු**

ශිෂ්‍යයන් කැඳවා වාචික හා ලිඛිත සාක්ෂ්‍ය ලබා ගැනීම සඳහා අදාළ නිලධාරියාට බලය පැවරෙන ශිෂ්‍ය විනය හා සම්බන්ධ පරීක්ෂණ කමිටු

විශ්වවිද්‍යාලය මගින් පත් කරනු ලබයි. එවැනි අවස්ථාවල දී බලධාරීන්ට සහාය දීම ශිෂ්‍යයන් අවශ්‍යයෙන් ම කළ යුත්තකි. මුරණ්ඩුකම නිසා හෝ බලධාරීන් විසින් පනවන ලද විධානයන්ට



අවනත වීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් බලධාරීන්ට සහාය නොදක්වන්නේ නම් එවැන්නකින් වටහා ගන්නේ විශ්වවිද්‍යාල බලාධිකාරය නොසලකා හැරීමක් ලෙසටය. එවැනි ක්‍රියාවක් විනය පරීක්ෂණයකට හේතු වන්නකි. එබැවින් බලධාරීන්ට අවශ්‍ය වූ විටෙක තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කළ විට එයට සහාය ලබා දෙන ලෙස ශිෂ්‍යයන්ට තරයේ අවවාද කෙරේ.

**16. අභියාචනා අයිතිය**

උපරිමාධිකරණය දක්වා අභියාචනා කිරීමේ අයිතිය මූලික අයිතිවාසිකම් තුළ අඩංගු වෙයි. මෙම සිද්ධාන්තය විශ්වවිද්‍යාලයට ද අදාළ වන්නේය. එබැවින් කිසියම් කරුණක් සම්බන්ධයෙන් විනය බලධාරීන් විසින් දෙන ලද තීරණයට එරෙහි ව උපකුලපතිවරයාට අභියාචනයක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කළ හැකි වෙයි. පොදු හෝ පෞද්ගලික වශයෙන් මෙය සිදු කළ හැකි අතර එවැනි අභියාචන සඳහා යෝග්‍ය මණ්ඩල මගින් අපක්ෂපාතී විනය පරීක්ෂණයක් පැවැත්වීමට උපකුලපතිවරයා විසින් අවසර දෙනු ලැබේ.



## රාජ්‍ය විශ්වවිද්‍යාල සිය ශිෂ්‍යයන්ට ලබා දීමට අපේක්ෂා කරන්නේ කුමක්ද ?

රාජ්‍ය විශ්වවිද්‍යාල යනු අයිතිවාසිකම්, වගකීම් සහ කැපවීමෙන් ඒවායෙහි ශක්‍යතාව තීරණය කොට පවත්වාගෙන යෑමටත් එහි මූලික භූමිකාව වන ඉගැන්වීම්, ඉගෙනීම්, ජනයාට සේවය කිරීම සහ පර්යේෂණ කාර්ය වර්ධනයන් කෙරෙහි යොමු වූ ශිෂ්‍ය සහ ආචාර්ය මණ්ඩලය යන දෙපක්ෂයෙන් යුතු පුද්ගල සමූහයකින් සමන්විත ස්ථානයන්ය.

- උපාධි අපේක්ෂක කාලය තුළ සිය ශිෂ්‍යයන් ඵලදායි පුද්ගලයන් බවට පත්වීම රාජ්‍ය විශ්වවිද්‍යාලවල අපේක්ෂාව වන්නේය. විශ්වවිද්‍යාල තම සෑම ශිෂ්‍යයකුගේ ම ආරක්ෂකයා ලෙස කටයුතු කරන්නේ ශිෂ්‍ය කටයුතුවල දී අප්‍රමාදී ව, කාර්යක්ෂම ව සහ ආචාර සම්පන්නව ශාස්ත්‍රීය ප්‍රමිතීන් අධිකාරි බලයෙන් පවත්වා ගෙන යෑමටත්, ශිෂ්‍යයන්ගේ හැසිරීම්, ආචාර ධර්මමය හා සදාචාරමය බව සහතික කරමින් වාර්ගික හා සාමාජික සුසංවාදය වර්ධනය කිරීමත් සඳහා ය.

- ලිඛිත සහ/ හෝ පරිගණක ජාල පදනම් කොට ගෙන පුළුල් අරමුණු සහිත ශාස්ත්‍රීය වැඩ සටහන් තෝරාගත හැකි පාඨමාලා/ මොඩියුල/ ඒකක සහ අරමුණු, අපේක්ෂිත ඉගෙනුම් ඵල, අන්තර්ගතය, ඇගැයීමේ විධික්‍රම සහ නිර්ණායක පැහැදිලි ව හා කාලීන ව රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් ශිෂ්‍යයන්ට ලබා දෙනු ලැබේ.

- ඉගැන්වීම සහ ප්‍රායෝගික ක්‍රම සම්මිශ්‍රණයෙන් අත්‍යවශ්‍ය හර දැනුම හා හැකියා රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් ලබා දෙනු ලැබේ. එවැන්නක් සිදු කරනු ලබන්නේ, විධිමත් පන්තිකාමර දේශන, රසායනාගාර හා ප්‍රායෝගික ක්ෂේත්‍ර, සැසි, පරිගණක ජාල සහ අන්තර්ජාල භාවිතයෙන් කෙරෙන ඉගැන්වීම්, පුහුණු පාඨමාලා, ශිෂ්‍ය පැවරුම් සහ ශිෂ්‍ය ව්‍යාපෘති මගිනි.

- සියලු පුස්තකාල පහසුකම්, භාෂා අධ්‍යයන, පරිගණක සේවා, මෘදු හැකියා හෝ ප්‍රගුණ කරවිය හැකි හැකියා, වෘත්තීය මාර්ගෝපදේශන සේවා ද සහිත පහසුකම් මගින් ශිෂ්‍යයන් පරිපූර්ණ පුද්ගලයන් වීම රාජ්‍ය විශ්වවිද්‍යාල සහතික කරයි.

- ශිෂ්‍යයන්ගේ නේවාසික පහසුකම්, සෞඛ්‍ය සේවා, ක්‍රීඩා හා විශ්‍රාන්තික පහසුකම්, සමාජ හා සංස්කෘතික කටයුතු, අධ්‍යයන කටයුතු පිළිබඳ උපදේශන සේවා, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ඉගෙනීම සඳහා සහාය වීම සහ සුරක්ෂිතභාවය හා ආරක්ෂාව සම්බන්ධ කටයුතු පිළිබඳ ව ද රාජ්‍ය විශ්වවිද්‍යාල සහතික වෙයි.

- විශ්වවිද්‍යාලය මගින් පනවන ලද නීතිරීතිවලට අනුගත ව මෙන් ම නීතිගරුක ජන අවධානය සහිත පුරවැසි සම්මුතිවලට අනුව ද සෑම ශිෂ්‍යයකු ම හැසිරෙන බවට රාජ්‍ය විශ්වවිද්‍යාල සහතික වෙයි.

- විශ්වවිද්‍යාලය මගින් පනවන ලද ප්‍රායෝගික නීති සංග්‍රහයට අනුව නොහැසිරෙන ශිෂ්‍ය ප්‍රජාව සාධාරණ, කාර්යක්ෂම හා අප්‍රමාදී විනය පරීක්ෂණ පවත්වා වැරදිකරුවන් බව ඔප්පු වුවහොත් තරයේ අවවාද කිරීමේ සිට සපයන ලද නේවාසික පහසුකම් ඉවත් කිරීම, තාවකාලික ව ශිෂ්‍ය භාවය අත්හිටුවීම හෝ විශ්වවිද්‍යාලයෙන් නෙරපීම දක්වා වූ දඬුවම් පමුණුවනු ලැබේ.

## රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් පෙරළා කුමක් අපේක්ෂා කරන්නේද?

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙතින් රාජ්‍ය විශ්වවිද්‍යාල අපේක්ෂිත කැපවීම / බැඳීම ශිෂ්‍ය ප්‍රඥප්තිය මගින් ලුහුඬු වශයෙන් දක්වා ඇත්තේය. එයට ම සමාන කැපවීමක්/බැඳීමක් විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන්, දෙමාපියන්, භාරකරුවන් හා පොදු ජනයාගෙන් අපේක්ෂා කරයි. ආයතනික නීතිරීතිවලට අනුගත වෙමින් ජනයා කෙරෙහි අවධානයෙන් මෙන් ම සෙසු සාමාජිකයන්ට ආදර්ශයක් වෙමින් යෝග්‍ය සාමාජික පරිවර්තනයක නියෝජිතයකු ලෙස කටයුතු කිරීම විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගෙන් විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.

ශිෂ්‍යයකු වශයෙන් ඔබ -

- ඔබේ වගකීම්, අයිතිවාසිකම් හා අදාළ විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අවනත විය යුතු බවට මනා අවබෝධයකින් සිටිය යුතුය.
- ශාස්ත්‍රීය හා පෞද්ගලික හැසිරීම පිළිබඳ විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අනුගත විය යුතු අතර ම ඔබේ සහපාඨීන් හා ආචාර්යවරුන් සමග ද සිවිල් සමාජයේ සමාජ ධර්මතාවලට අනුකූල ව හැසිරෙන බවට ද සහතික විය යුතුය.
- විශ්වවිද්‍යාලයේ කීර්තිභාවය ආරක්ෂාවන පරිදි විශ්වවිද්‍යාල භූමිය තුළ, විශ්වවිද්‍යාල නේවාසිකාගාරයේ සහ සමාජයේ වගකිව යුතු පුද්ගලයකු ලෙස හැසිරිය යුතුය.
- විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය, සහපාඨීන්, අසල්වැසියන් සහ සමාජයේ වෙසෙන පුද්ගලයන්ගේ ජාතිය, වාර්ගික භාවය, ලිංගික ලැදියා, ආගමික විශ්වාස හා අනුබන්ධන, දේශපාලන පිළිගැනීම්, පාක්ෂිකභාවය සහ/ හෝ වෘත්තීය සමිති සාමාජිකත්වය පිළිබඳ ව නොසලකමින් ඔවුන් සමග කටයුතු කිරීමේ දී ආචාරශීලී, ගෞරව සහිත මෙන් ම ඔවුන් පිළිබඳ සැලකිලිමත් භාවයක් ද ඔබ තුළ තිබිය යුතුය.
- විශ්වවිද්‍යාල පරිසරය එහි ගොඩනැගිලි සහ පහසුකම් කෙරෙහි දැඩි සැලකිල්ලක් හා ගෞරවයක් දක්විය යුතුය.
- අධ්‍යයන, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු අන්වේෂණයට සුදුසු සෞන්දර්යාත්මක වශයෙන් චිත්තාකර්ශනීය සහ සන්සුන් පරිසරයක්

විශ්වවිද්‍යාලය තුළ පවත්වා ගෙන යෑමට සහාය වන්නට කැප විය යුතුය.

### රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් පෙරළා කුමක් අපේක්ෂා කරන්නේද?...

- අසල්වැසි ගම් සහ නගර වැසියන්ට ආචාරශීලි වීම මෙන් ම විශ්වවිද්‍යාලයට පැමිණෙන අමුත්තන්ට කායික හෝ මානසික වශයෙන් වේදනා පැමිණවීම වැනි විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානි වන පරිදි නොහැසිරිය යුතුය.

- භූගෝලීය වශයෙන් පිහිටි ස්ථානය ගැන නොසිතා විශ්වවිද්‍යාලයෙන් ලබා ගත හැකි පහසුකම් හා සම්පත් සෙසු අයගේ ද අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අධ්‍යන වැඩසටහන් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමත්, දුලබ සම්පත් අනාගත පරම්පරාවල ප්‍රයෝජනය උදෙසා සුරක්ෂා කිරීමටත් කැපවිය යුතුය.

- අධ්‍යයන වැඩ සටහන් සඳහා වන සෑම අවශ්‍යතා පිළිබඳ තොරතුරු කියවා හොඳින් දැන සිටිය යුතු අතර සැලසුම් කළ සහ සියලු නිර්දිෂ්ට දේශන, ප්‍රායෝගික පන්ති, නිබන්ධන පන්ති, සම්මන්ත්‍රණ සහ වෙනත් අධ්‍යයන වැඩ සටහන්වලට සහභාගී විය යුතුය.

- සැලසුම් කළ සියලු විභාගවලට සූදානම් වී හැකි ඉහළම ශ්‍රේණි ලබා ගැනීමට උත්සුක විය යුතු අතර ම පෞද්ගලික අභිවෘද්ධිය සඳහා වන අර්ථ පූර්ණ දැනුම ලබා ගැනීමට උත්සුක විය යුතුය.

- ශිෂ්‍ය පැවැරුම්, ව්‍යාපෘති සහ වාර්තා ඉදිරිපත් කිරීම වැනි විධිමත් ඇගැයීමක් සඳහා අවශ්‍ය අධ්‍යයන කටයුතුවලට සහභාගි විය යුතුය.

- විශ්වවිද්‍යාලයේ දී ලැබූ ශිෂ්‍ය කේන්ද්‍රීය සහ සංයෝගී ඉගැන්වීම් (මුහුණට මුහුණ ලා කෙරෙන ඉගැන්වීම්, පරිගණක පදනම් කොට ගත් ඉගැන්වීම් සහ ඉගෙනුම් සැසි, මාර්ගගත ඉගෙනුම් කට්ටල සහ ඇගැයීම්, ශිෂ්‍ය පැවරුම් සහ ව්‍යාපෘති ආදිය) අගයමින් එම අත්දැකීම් පදනම් කොට ගෙන හවුල් වගකීම් හා අවශ්‍ය සුදුසුකම් ඇත්තකු ලෙස විශ්වවිද්‍යාලයේ අභිවර්ධනය සඳහා ස්වාධීන ව අධ්‍යාපනය ලබන්නකු ලෙස කටයුතු කළ යුතුය.

- අධ්‍යයන කටයුතු සඳහා ඔබට ලැබෙන්නට සැලැස් වූ පාඨමාලා, මොඩියුල පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට ලබා දී ඇති අවස්ථාවල දී පූර්ණ වශයෙන් සහ සංවර්ධනාත්මක ආකාරයට ඒවාට සහභාගී විය

යුතු අතර එමගින් ඔබ සහ ඔබේ අනුප්‍රාප්තිකයන් වෙත ලබා දෙන ප්‍රතිපාදන වැඩිකර ගත යුතුය.

## *රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් පෙරළා කුමක් අපේක්ෂා කරන්නේද?...*

- ශාස්ත්‍රීය උපදේශන, ශිෂ්‍ය උපදේශන, වෘත්තීය මාර්ගෝපදේශන වැනි ශිෂ්‍ය සහාය සේවාවලින් ප්‍රයෝජන ලැබිය යුතු අතර පෞද්ගලික ප්‍රශ්න, ශාස්ත්‍රීය අධ්‍යයන අපහසුතා විසඳීමට උදව් ලබා ගත හැකි යැයි සිතෙන අවස්ථාවල දී වගකීම් දැරීම සහ 'වැඩ ලෝකය' සඳහා අවශ්‍ය වන පරිපූර්ණ සාමාන්‍ය කුසලතා ලැබ රැකියා තෝරා ගෙන එම ක්ෂේත්‍රවල ඉදිරියට යා යුතුය.

- විවිධ වාර්ගික සහ සමාජ පසුබිම්වලට අයත් සහපාඨීන් සමග සිදු කරන අන්තර් ක්‍රියා මගින් ආත්ම සංවර්ධනයට අවස්ථා ලබා ගනිමින් ද තරගකාරී සහ විනෝදාත්මක ක්‍රියාවල දී සිය කුසලතා වර්ධනය කර ගනිමින් ද සංස්කෘතික හා සෞන්දර්යාත්මක කාර්යයන්හි පූර්ණ වශයෙන් නිරත විය යුතුය.

- තැති ගැන්වීම්, හිරිහැර කිරීම් සහ බියෙන් තොර ව විශ්වවිද්‍යාලයේ ගෞරවය සහ කීර්තිනාමය ආරක්ෂා කොට විශ්වවිද්‍යාලය ආරක්ෂිත, සුරක්ෂිත යහපත් ස්ථානයක් බවට පත් කිරීමට පෞද්ගලිකව ම වගකීම් දැරිය යුතුය.

- බරපතල විනය උල්ලංඝනයක හේතුවෙන් ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍ය කණ්ඩායමකට විනය පරිපාටිය මගින් නියම කළ දඬුවම් ක්‍රියාත්මක කිරීමට අනුබල දීම මගින් එවැනි ක්‍රියා වැළැක්වීමට සහායක ව කටයුතු කළ යුතුය.

- පෞද්ගලික ව ඔබට හෝ ඔබේ සහපාඨීයකුට මුහුණ දෙන්නට සිදු වූ අසාධාරණය, හිරිහැරය හෝ තැති ගැන්වීම පිළිබඳ බලධාරීන්ට තොරතුරු දැන්වීමේ වගකීම දැරීම මෙන් ම අවශ්‍ය විටෙක විනය පරීක්ෂණ කටයුතුවල දී සහාය දීම ද කළ යුතු ය.

- ඔබේ ආරක්ෂාව මෙන් ම සෞඛ්‍යය පිළිබඳව ද ඔබ වගකිව යුතු අතර ඔබේ මිත්‍රයන්ගේත්, සහපාඨීන්ගේත් ශුභසාධනය පිළිබඳව ද අවධානයෙන් සිටිය යුතුය. සහපාඨීයකු බරපතල අසනීපයකින් පෙළෙන විට හෝ රෝහල් ගතකිරීමක් අවශ්‍ය වන විටෙක ඒ පිළිබඳ ව අධ්‍යයන අංශය/පීඨ කාර්යාලය හෝ ශිෂ්‍ය සහාය අධ්‍යක්ෂ, සුබ

සාධක හෝ ආයතනයේ/පීඨයේ ශිෂ්‍ය උපදේශක වෙත වහා ම දැනුම් දිය යුතුය.

***රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් පෙරළා කුමක් අපේක්ෂා කරන්නේද?...***

- ශිෂ්‍ය සංගම්/සංවිධාන පිහිටුවීම සඳහා දෙනු ලබන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගත යුතුය. ඔබ ශිෂ්‍ය සංගමයක/ සංවිධානයක සාමාජිකයකු වන්නේ නම් දේශපාලන අරමුණු මගින් මෙහෙය වන ව්‍යාපාරවල අතකොළුවක් බවට පත් නොවී, පරිණත හා විචක්ෂණශීලීව හැසිරිය යුතුය. විශ්වවිද්‍යාලයේ/ ආයතනයේ, පීඨයේ විධිමත් තීරක මණ්ඩල සහ ශිෂ්‍ය ආචාර්ය කමිටුවල දී ශිෂ්‍යයන් නියෝජනය කරන ශිෂ්‍ය සංගමයේ/ සංවිධානයේ සාමාජිකයකු ලෙස ඔබේ නායකත්ව හැකියා සහ ගුණාත්මක බව ප්‍රකට වන පරිදි විචාරශීලී, පරිණත හා වගකීමෙන් යුතුව ඔබේ අදහස් ප්‍රකාශ කළ යුතුය. සංගමයේ/සංවිධානයේ සාමාජිකයන් සමග සිදු කරන ඒකාබද්ධ කාර්යයන්හි දී මධ්‍යස්ථභාවය, එකඟතාව සහ අවබෝධය පදනම් කොට ගෙන කටයුතු කළ යුතුය. විශ්වවිද්‍යාලයේ ගෞරවයට හානිවන අන්දමේ කිසිදු ක්‍රියාවක නොයෙදෙන බවට ඔබ සහතික විය යුතුය.